 ISSN 3093-6217

the Socialist

ශ්‍රී ලංකාවේ හා දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වයේ මාසික ප්‍රකාශනය

භූ දේශපාලනය | න්‍යාය | ඉතිහාසය| පන්ති අරගල

## ජෙන්-Z නැගිටීම් සහ නායකත්වයේ අර්බුදය: 'නායකත්වයක් නොමැති' ව්‍යාපාර සහ 'වාම ජනතාවාදයට' එරෙහිව නොනවතින විප්ලවය

ව්‍යාජ වමේ ජාත්‍යන්තර ස්වභාවය අහඹු සිදුවීමක් නොවේ: මෙම සංවිධාන සහභාගී වන්නේ, එක්සත් ජනපදය තුළ ISO විසින් මූර්තිමත් කරන ලද, ධනවාදය ආරක්ෂා කිරීම සහ කම්කරු පන්ති අන්‍යෝන්‍ය කළමනාකරණය කිරීම ඔවුන්ගේ ද්‍රව්‍යමය අවශ්‍යතාවක් වන ධනවත් මධ්‍යම පන්තික ස්ථර නියෝජනය කරන එකම ජාත්‍යන්තර දේශපාලන ධාරාවට ය. පි.9

## ට්‍රම්ප්ගේ ඇමරිකාවේ සැබෑ තත්වය: සමාජ කාලකන්නිභාවය, ආඥාදායකත්වය, යුද්ධය —සහ පන්ති අරගලයේ නැගීමක්

නිදහස් ප්‍රකාශනයේ සිට 250 වන වසර වන විට ට්‍රම්ප්ගේ ඇමරිකාවේ සැබෑ තත්වය මෙයයි: එය, ස්වර්ණමය යුගයේ (Gilded Age) සිට නොදුටු පරිමාණයකින් පන්ති ප්‍රතිවිරෝධතාවලින් ඉරිතලා ගිය, ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ මවාපෑම පවා අත්හැර දැමූ, විදේශයන්හි යුද්ධයට සහ රට තුළ ආඥාදායකත්වයට නැඹුරු වූ අපරාධකාරී කතිපයාධිකාරීත්වයක් විසින් පාලනය කරන ලද සමාජයකි. පි.15

## චීනයේ BYD හි ෂියාන් කම්හලේ කම්කරුවෝ දරිද්‍රතා වැටුප් වලට එරෙහිව වැඩ වර්ජනය කරති

ෂියෑන් වැඩ වර්ජනය හුදකලා සිදුවීමක් නොවේ. එය වසර ගණනාවක් පුරා විහිදෙන සහ රටවල් ගණනාවක් සහ චීනයේ පළාත් පුරා පැතිරී ඇති BYD හි දැවැන්ත නිෂ්පාදන අධිරාජ්‍යය පුරා උත්සන්න වන කම්කරු නොසන්සුන්තාවයේ රටාවක නවතම පිපිරීමයි. පි.18

## එප්ස්ටයින් ලිපිගොනු ඇමරිකානු කතිපයාධිකාරයේ සාපරාධීත්වය හෙළි කරයි

පි.20




## මියුනිච් යුද සමුළුව

ජර්මානු චාන්සලර් ෆ්‍රෙඩ්රික් මර්ස් සමුළුව ආරම්භ කළේ "එක්ව, අපි නැවත වරක් බලයෙන් සහ සියල්ලටත් වඩා මහා බල දේශපාලනයෙන් විවෘතව සංලක්ෂිත යුගයකට එළිපත්ත තරණය කර ඇත්තෙමු" යනුවෙනි. අයිතිවාසිකම් සහ නීති මත පදනම් වූ ජාත්‍යන්තර පිළිවෙල තවදුරටත් නොපවතින බව ඔහු පැවසීය. මෙම යථාර්ථය හඳුනාගෙන "නව යුගය සඳහා සූදානම් වීම" යුරෝපීය බලවතුන්ගේ කාර්යයකි. පි.2



## වෙනිසියුලා ආක්‍රමණය: ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අර්බුදයේ හැරවුම් ලක්ෂයයක්

අන්තර් අධිරාජ්‍යවාදී එදිරිවාදිකම් නියාමනය කිරීමට සහ නව යටත් විජිත සූරාකෑම සඳහා නීත්‍යානුකූලභාවයේ ආවරණයක් සැපයූ පශ්චාත්-යුධ ආයතන, උග්‍ර ධනේශ්වර අර්බුදයක තත්වයන් යටතේ, කොල්ලකෑමට බාධාවක් බවට පත්ව ඇත. එම පිළිවෙල බිඳ වැටී ඇත. පි.4

# මියුනිච් යුද සමුළුව

**පීටර් ෂ්වාස්** විසිනි.

*මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) 2026 පෙබරවාරි 15 වන දින '**The Munich War Conference**' යන හිසින් පළවූ **පීටර් ෂ්වාස්** විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.*




2026 පෙබරවාරි 14 වන සෙනසුරාදා ජර්මනියේ මියුනිච් හි පැවති මියුනිච් ආරක්ෂක සමුළුවේදී එක්සත් ජනපද රාජ්‍ය ලේකම් මාර්කෝ රුබියෝ කතා කරයි.[AP ඡායාරූපය/ ඇලෙක්ස් බ්‍රැන්ඩන්]

පසුගිය දින තුන තුළ ලොව පුරා රාජ්‍ය සහ ආණ්ඩු නායකයින් 60 දෙනෙකු පමණ සහ අමාත්‍යවරුන්, දේශපාලනඥයින්, ඉහළ පෙළේ හමුදා නිලධාරීන් සහ ආරක්ෂක විශේෂඥයින් සිය ගණනක් එක්රැස් කළ මියුනිච් ආරක්ෂක සමුළුව (MSC) තියුණු ආතතීන්ගෙන් සලකුණු විය. නමුත් එක් කාරණයක් සම්බන්ධයෙන්, සියලුම සහභාගිවන්නන් එකඟ විය: රාජ්‍ය තාන්ත්‍රික උපාමාරු සහ ජාත්‍යන්තර ආයතන මගින් අධිරාජ්‍යවාදී බලවතුන්ගේ අවශ්‍යතා සඟවා තිබූ යුගය අවසන්. මිලිටරි බලය සහ යුද්ධය හරහා ඒවා විවෘතව තීරණය කරන නව යුගයක් ආරම්භ වී තිබේ.

සමුළුවේ විවාද කේන්ද්‍රගත වූයේ තුන්වන ලෝක යුද්ධයක් වළක්වා ගන්නේ කෙසේද යන්න වටා නොව, ඒ සඳහා හොඳටම සූදානම් වන්නේ කෙසේද යන්න වටා ය. ඇමරිකා එක්සත් ජනපදයේ සහ යුරෝපයේ පාලක කවයන් යුද්ධය සලකන්නේ අවශ්‍ය සහ නොවැළැක්විය හැකි දෙයක් ලෙස ය.

ජර්මානු චාන්සලර් ෆ්‍රෙඩ්රික් මර්ස් සමුළුව ආරම්භ කළේ "එක්ව, අපි නැවත වරක් බලයෙන් සහ සියල්ලටත් වඩා මහා බල දේශපාලනයෙන් විවෘතව සංලක්ෂිත යුගයකට එළිපත්ත තරණය කර ඇත්තෙමු" යනුවෙනි. අයිතිවාසිකම් සහ නීති මත පදනම් වූ ජාත්‍යන්තර පිළිවෙල තවදුරටත් නොපවතින බව ඔහු පැවසීය. මෙම යථාර්ථය හඳුනාගෙන "නව යුගය සඳහා සූදානම් වීම" යුරෝපීය බලවතුන්ගේ කාර්යයකි.

දීර්ඝ ෆැසිස්ට්වාදී දෝෂ කථනයක් කරමින්, එක්සත් ජනපද රාජ්‍ය ලේකම් මාර්කෝ රුබියෝ මෑත දශකවල ජාත්‍යන්තර දේශපාලනයට පහර දුන්නේය. වසර 35 කට පෙර සෝවියට් සංගමයේ අවසානය යන්නෙන් අදහස් කළේ "ඉතිහාසයේ අවසානය" ය යන්න "භයානක මායාවක්" වූ අතර එය දැන් ට්‍රම්ප් පරිපාලනය විසින් නිවැරදි කරනු ලැබෙමින් පවතී.

රුබියෝ මෙසේ පැවසුවේය: "මෙම මායාව තුළ, අපි නිදහස් හා නිර්බාධී වෙළඳාම පිළිබඳ අධානග්‍රාහී දැක්මක් වැළඳ ගත්තෙමු. ... බොහෝ ජාතීන් තමන්ව ආරක්ෂා කර ගැනීමේ හැකියාව පවත්වා ගැනීමේ වියදම් කපා හරිමින් දැවැන්ත සුභසාධන රාජ්‍යයන්හි ආයෝජනය කළ අතර, අපි අපගේ ස්වෛරීභාවය ජාත්‍යන්තර ආයතනවලට වැඩි වැඩියෙන් පැවරීමු. ... දේශගුණය ඇදහීම පිළිබඳ සංස්කෘතියක් සංතර්පනය කිරීම සඳහා, අපගේ ජනතාව දුප්පත් කරන බලශක්ති ප්‍රතිපත්ති අප මත පටවාගෙන ඇත්තෙමු. ... දේශසීමා නොමැති ලෝකයක් ලුහුබැඳීමේදී, අපගේ සමාජවල සංගතභාවයට, අපගේ සංස්කෘතියේ අඛණ්ඩතාවයට සහ අපගේ ජනතාවගේ අනාගතයට තර්ජනයක් වන පෙර නොවූ විරූ මහා සංක්‍රමණ රැල්ලකට අපි අපගේ දොරටු විවෘත කළෙමු." රුබියෝට අනුව, මෙය "මානව ස්වභාවය සහ වසර 5,000 කට අධික වාර්තාගත මානව ඉතිහාසයේ පාඩම් නොසලකා හරින ලද මෝඩ අදහසක් විය. එය අපට බෙහෙවින් වියදම් සහගත වී ඇත."

පසුගිය වසරේ මියුනිච් ආරක්ෂක සමුළුවේදී එක්සත් ජනපද උප ජනාධිපති ජේ.ඩී. වැන්ස් යුරෝපීය බලවතුන්ට එරෙහිව සෘජු ප්‍රහාරයක් දියත් කළ ද, රුබියෝ වඩාත් සහනදායක ස්වරයකින් කතා කළේය. කොමියුනිස්ට් විරෝධී සහ ෆැසිස්ට් ඒකාකෘති වලින් පිරුණු කතාවකදී, ඔහු "සියවස් ගණනාවක බෙදාහදා ගත් ඉතිහාසය, ක්‍රිස්තියානි ඇදහිල්ල, සංස්කෘතිය, උරුමය, භාෂාව, පෙළපත් පරම්පරාව සහ අපගේ මුතුන් මිත්තන් එක්ව කළ කැපකිරීම්" සිහි කැඳවූ අතර "යුරෝපය ශක්තිමත් වීම අපට අවශ්‍යයි" යනුවෙන් අවධාරණය කළේය.

පැමිණ සිටි රාජ්‍ය නායකයින් නැගී සිට ඔහුට ස්තුති කළහ. "අපගේ මිත්‍ර පාක්ෂිකයන් වරදකාරිත්වයෙන් හා ලැජ්ජාවෙන් බැඳ තැබීමට අපි කැමති නැත" යන රුබියෝගේ ප්‍රකාශය, නාසීන්ගේ අපරාධ, ශ්‍රේෂ්ඨත්වය සඳහා ඔවුන්ගේ අලුත් වූ අභිලාෂයන් මන්දගාමී කිරීමට ඉඩ නොදිය යුතු බවට දිගු කලක් තිස්සේ පෙනී සිටියාවූ, පැමිණ සිටි ජර්මානුවන් විසින් විශේෂයෙන් හොඳින් පිළිගනු ලැබූ බවට සැකයක් නැත.

කෙසේ වෙතත්, රුබියෝට තියුණු අන්තර්-අත්ලාන්තික් සාගර ආතතීන් විසඳීමට නොහැකි විය. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් විනාශ කිරීම, ICE ගෙස්ටාපෝව විසින් සංක්‍රමණිකයන් දඩයම් කිරීම, දේශීයව හමුදාව යෙදවීම, ඒකාධිපති පාලන තන්ත්‍රයක් ස්ථාපිත කිරීම වැනි ට්‍රම්ප්ගේ ෆැසිස්ට් ප්‍රතිපත්ති වලින් යුරෝපීය බලවතුන් කරදරයට පත් නොවේ. ගාසා තීරයේ ජන සංහාරය, ඉරානයට බෝම්බ හෙලීම, වෙනිසියුලානු ජනාධිපති

මදුරෝ පැහැර ගැනීම වැනි ඔහුගේ අධිරාජ්‍යවාදී යුද්ධවලට හෝ චීනයට එරෙහිව යුද්ධයට ඔහු සූදානම් වීමට ඔවුන් විරුද්ධ වන්නේ ද නැත. මෙහිදී, යුරෝපීය පාලක පන්තිය සම්පූර්ණයෙන්ම එකඟතාවයෙන් සිටී.

ට්‍රම්ප් ඉරානයට එරෙහිව දැවැන්ත යුධ හමුදාවක් එක්රැස් කරමින් එරටට එරෙහිව දැවැන්ත මිලිටරි ප්‍රහාර එල්ල කරන බවට තර්ජනය කළද, සමුළුවේදී මේ සම්බන්ධයෙන් එක හඬක්වත් නැගුණේ නැත. ඊට පටහැනිව, සමුළුව ඊළඟ අධිරාජ්‍යවාදී අපරාධය සඳහා ප්‍රවර්ධන වේදිකාවක් ලෙස සේවය කළේය. 1979 විප්ලවයෙන් බලයෙන් පහ කරන ලද ෂා රජුගේ පුත් රේසා පහ්ලවි, ආරාධිත අමුත්තෙකු ලෙස ආරාධනා කරන ලද අතර යුරෝපය පුරා තැන්වලින් ගෙන්වා ගත් ආධාරකරුවන්ට සමුළුවෙන් පිටත සිට කතා කළේය. ඔහුගේ ඉල්ලීම: 1953 කුමන්ත්‍රණයෙන් පසු සීඅයිඒ සංවිධානය ඔහුගේ පියා පිහිටවූ ආකාරයටම, එක්සත් ජනපදය ඉරානයට බෝම්බ දමා නව පාලකයා ලෙස ඔහුව පත් කළ යුතුය.

යුරෝපීය සංගමය (EU) සහ ඇමරිකා එක්සත් ජනපදය අතර ආතතීන් කේන්ද්‍රගත වන්නේ ට්‍රම්ප් යුරෝපීය භාණ්ඩ සඳහා දණ්ඩනීය තීරුබදු පැනවීම, ග්‍රීන්ලන්තය බලහත්කාරයෙන් ඈඳා ගැනීමට ඔහු කරන තර්ජනය සහ සියල්ලටත් වඩා යුරෝපීයයන්ගේ හිසට ඉහළින් රුසියාව සමඟ එකඟතාවයකට පැමිණීමට ඔහු දරන උත්සාහය මත ය.

රුසියාවට එරෙහි යුද්ධය උත්සන්න කිරීම, චාන්සලර් මර්ස් සිය මියුනිච් කතාවේදී ඉල්ලා සිටි "නව යුගය සඳහා සූදානම් වීමේ" හදවතයි. යුක්රේනයට එරෙහි රුසියාවේ ප්‍රහාරය දිගු කලක් තිස්සේ යුරෝපීය බලවතුන්ට සීමාවකින් තොරව සන්නද්ධ වීමට සහ මහා බලවතෙකුගේ තත්ත්වය සඳහා තමන්ගේම සැලසුම් සමඟ ඉදිරියට යාමට කඩතුරාවක් ලෙස සේවය කර ඇත. නමුත් රුසියාව ආක්‍රමණිකයා බවත් මුළු යුරෝපයම යටත් කර ගැනීමට සැලසුම් කරන බවත් ඔවුන් කරන ප්‍රකාශය යථාර්ථය ඔලුවෙන් පිහිටුවයි.

ඇත්ත වශයෙන්ම, වෝර්සෝ ගිවිසුම සහ සෝවියට් සංගමය විසුරුවා හැරීමෙන් පසු සියලු ගිවිසුම් කඩ කර නැගෙනහිර දෙසට ඉදිරියට ගියේ නේටෝවයි. මුළු නැගෙනහිර යුරෝපයම දැන් මිලිටරි සන්ධානයේ කොටසකි. 2014 දී, ඇමරිකා එක්සත් ජනපදය සහ ජර්මනිය, කියෙව්හි බටහිර ගැති කුමන්ත්‍රණයක් සංවිධානය කළ අතර යුක්රේන හමුදාව ක්‍රමානුකූලව සන්නද්ධ කිරීමට පටන් ගත්හ. එහි පැවැත්මට තර්ජනයක් වන, රුසියාව සමඟ කිලෝමීටර් 2,000 ක් දිග (සැතපුම් 1,242 ක් දිග) දේශසීමාවක් සහිත රට, නේටෝව තුළට ගෙන ඒමේ සැලසුම් අවසානයේ මොස්කව් ප්‍රහාරයකට පොළඹවනු ලැබිණි. නේටෝව හිතාමතාම යුද්ධය අවුලුවා ලීය.

එතැන් සිට, නේටෝව යුක්රේනය තුළ රුසියාවට එරෙහිව ප්‍රොක්සි යුද්ධයක් දියත් කර ඇත. යුද්ධය ආරම්භයේ සිට, යුරෝ බිලියන 380 ක බටහිර මිලිටරි සහ මූල්‍ය ආධාර කියෙව් වෙත ගලා ගොස් ඇත. එවා නොමැතිව යුද්ධය බොහෝ කලකට පෙර තීන්දු වීමට නියමිත ව තිබුණි. නමුත් ට්‍රම්ප් බොහෝ දුරට එක්සත් ජනපද මූල්‍ය ආධාර කපා හැර ඇති අතර යුරෝපීයයන් සම්පූර්ණ පිරිවැය දැරිය යුතු බව අවධාරණය කරයි. යුරෝපීයයන් බිල්පත කල්තියා ගෙවන්නේ නම් පමණක් එක්සත් ජනපද ආයුධ යුක්රේනයට සපයනු ලැබේ.

ඔවුන් පසුබැසීමට සූදානම් නැත. ඔවුන්ට රුසියාව යටත් කර ගැනීමට අවශ්‍ය වන අතර මහා බලවතෙකුගේ තත්ත්වය සඳහා ඔවුන්ගේම සැලසුම් සාක්ෂාත් කර ගැනීම සඳහා යුද්ධය අවශ්‍ය වේ. යුක්රේනයේ යුද්ධය ආරම්භයේ සිට, ජර්මනිය පමණක් බුන්ඩෙස්වෙර් (ජර්මානු සන්නද්ධ හමුදා) නැවත සන්නද්ධ කිරීම සහ යුද්ධය සඳහා එහි යටිතල පහසුකම් සකස් කිරීම වෙනුවෙන් යුරෝ ට්‍රිලියන 1 කට වඩා අත්කර ගෙන ඇත. සමස්ත සමාජයම යුද පදනමකට ගෙනැවිත් බලහත්කාරයෙන් බඳවා ගැනීම නැවත හඳුන්වා දිය යුතුය.

චාන්සලර් මර්ස් සිය මියුනිච් කතාවේදී මෙසේ පැහැදිලි කළේය: "යුරෝපය අවධානම් වළක්වා ගැනීම දක්වා පසුබැසිය යුතු නැත. යුරෝපය අවස්ථා විවෘත කර එහි ශක්තිය මුදා හැරිය යුතුය. … එය තමන්ගේම ආරක්ෂක ප්‍රතිපත්ති මූලෝපායන් සමඟ ගෝලීය දේශපාලනයේ සාධකයක් බවට පත්විය යුතුය." බුන්ඩෙස්වෙර් "හැකි ඉක්මනින් යුරෝපයේ ශක්තිමත්ම සාම්ප්‍රදායික හමුදාව" බවට පත් කිරීමේ ඉලක්කය ඔහු නැවත තහවුරු කළේය.

ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් ඉල්ලා සිටියේ යුරෝපය භූ දේශපාලනික බලවතෙකු බවට පත්විය යුතු බවත්, එයට පැහැදිලිවම න්‍යෂ්ටික වැළැක්වීම ද ඇතුළත් විය යුතු බවත්ය. මේ සම්බන්ධයෙන් චාන්සලර් මර්ස් සහ අනෙකුත් යුරෝපා සංගම් රජයේ ප්‍රධානීන් සමඟ තමා දැනටමත් "මූලෝපායික සංවාදයක්" ආරම්භ කර ඇති බව ඔහු පැවසීය.

බ්‍රිතාන්‍ය අගමැති කියර් ස්ටාර්මර් යුරෝපය සමඟ සමීප මිලිටරි සහයෝගීතාවයකට කැපවී සිටියේය. යුරෝපීයයන් "අපගේම දෘඪ බලය ගොඩනගා ගත යුතුය, මන්ද එය යුගයේ මුදල් ඒකකයයි යි. අපට ආක්‍රමණ වැළැක්වීමට හැකි විය යුතු අතර, ඔව්, අවශ්‍ය නම්, අපි සටන් කිරීමට සූදානම් විය යුතුය."

ජාත්‍යන්තර කම්කරු පන්තියේ දේශපාලන මැදිහත්වීමකින් තොරව අනිවාර්යයෙන්ම තුන්වන ලෝක යුද්ධයකට තුඩු දෙන මෙම මිලිටරි සුපිරි බල ප්‍රතිපත්තියට ස්ථාපිත පක්ෂ අතර කිසිදු විරෝධයක් නොමැත. ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ට අමතරව, හරිතයන්, වාම පක්ෂය සහ ඔවුන්ගේ සහෝදර සංවිධාන ද එයට සහාය දක්වයි.

ඇමරිකා එක්සත් ජනපදයේ සිට මියුනිච් වෙත ගමන් කළ ඩිමොක්‍රටික්වරු රුසියාවට එරෙහි යුද්ධය තීව්‍ර කිරීම සඳහා වූ යුරෝපීය ඉල්ලීමට සහාය දැක්වූහ. ජර්මනියේ වාම පක්ෂය සමඟ

සන්ධානගතව සිටින ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන්ගේ (DSA) සාමාජිකාවක් වන කොංග්‍රස් සභික ඇලෙක්සැන්ඩ්‍රියා ඔකාසියෝ-කෝර්ටෙස්, ට්‍රම්ප් සිය ඉවත් වීම හරහා, “පුටින්ට යුරෝපය වටා කඩුව ලෙලවා එහි සිටින අපගේම සගයන් වටා හිරිහැර කිරීමට උත්සාහ කළ හැකි” තත්වයන් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් ඔහුට චෝදනා කළාය.

යුද තර්ජනය නැවැත්විය හැක්කේ යුද්ධයේ සහ මිලිටරිවාදයේ පිරිවැය දරාගත යුතු ජාත්‍යන්තර කම්කරු පන්තියේ ස්වාධීන ව්‍යාපාරයකට පමණි. එවැනි ව්‍යාපාරයක් සමාජ වියදම් කප්පාදුවට, ආඥාදායකත්වයට සහ යුද්ධයට එරෙහි අරගලය, ඒවායේ හේතුව වන ධනවාදයට එරෙහි අරගලය සමඟ සහ සමාජවාදී සමාජයක් ගොඩනැගීම සඳහා සටන සමඟ ඒකාබද්ධ කළ යුතුය. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක) සහ සමාජවාදී සමානතා පක්ෂ (සසප) මෙම ඉදිරිදර්ශනය සඳහා සටන් කරයි.

**යුද්ධයට, කප්පාදුවට හා ආඥාදායකත්වයට එරෙහිව ලෝක සමාජවාදී වැඩපිළිවෙලකට සටන් වදිනු!**

**ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය ලෙස සමාජවාදී සමානතා පක්ෂය ගොඩ නගනු!**

# වෙනිසියුලා ආක්‍රමණය: ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අර්බුදයේ හැරවුම් ලක්ෂ්‍යයක්

**සංජය ජයසේකර** විසිනි.

මෙම ලිපිය 2026 ජනවාරි 10 දින ඉංග්‍රීසි බසින් ‘The Venezuela Invasion: A Turning Point in the Crisis of American Imperialism’ සිරසින් thesocialist.lk හි පළ විය.

2026 ජනවාරි 3 වන දින වෙනිසියුලාවට එල්ල කරන ලද එක්සත්



වෙනිසියුලානු ජනාධිපති නිකොලස් මධුරෝ. ඡායඡායාරූපය www.aa.com.trn අනුග්‍රහයෙනි.

ජනපද මිලිටරි ප්‍රහාරය සහ ජනාධිපති නිකොලස් මධුරෝ බලහත්කාරයෙන් අල්ලා ගැනීම, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ පරිහානිය සහ 1945 න් පසු ස්ථාපිත නෛතික පිළිවෙළ (order) බිඳවැටීමේ සන්ධිස්ථානයකි. මෙය තක්කඩි “වැටලීමක්” හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුමක් නොව මූලෝපායික සම්පත් සහ භූ-දේශපාලනික අවකාශය පාලනය කිරීම සඳහා සිදු කරන ලද ආක්‍රමණශීලී යුද්ධයකි. ලෝක සමාජවාදී වෙබ් අඩවිය (WSWS) අවධාරණය කළ පරිදි, මෙහෙයුම නියෝජනය කරන්නේ, “ට්‍රම්ප් පාලන තන්ත්‍රය විසින් නීත්‍යානුකූලභාවයේ සියලු ස්වරූපයක්ම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමක්... ජාත්‍යන්තර නීතිය බරපතල ලෙස උල්ලංඝනය කරමින් දියත් කරන ලද ප්‍රකෝප නොකළ ආක්‍රමණශීලී යුද්ධයක්” බවයි. [1] බටහිර අර්ධගෝලය පුරා කඳවුරු 20 කින් දියත් කරන ලද ගුවන් යානා 150 කට අධික සංඛ්‍යාවක් යෙදවීම, කැරකස් සහ අවට ප්‍රාන්ත හරහා දැඩි බෝම්බ හෙලීම්, නාවික අවහිරයක් යෙදීම සහ කියුබානු හමුදා නිලධාරීන් 32 ක් ඇතුළුව අවම වශයෙන් 100 ක් ඝාතනය කිරීම, මෙහෙයුමේ ස්වභාවය මත්ද්‍රව්‍ය විරෝධී ක්‍රියාමාර්ගයකට වඩා මහා පරිමාණ මිලිටරි යටත් කිරීමක් බව අවධාරණය කරයි.

**ද්‍රව්‍යමය පදනම්: තෙල්, මූල්‍ය ප්‍රාග්ධනය සහ භූ දේශපාලනික එදිරිවාදිකම්**

මෙම ප්‍රහාරය සමකාලීන අධිරාජ්‍යවාදය මෙහෙයවන ද්‍රව්‍යමය අවශ්‍යතා හරහා තේරුම් ගත යුතුය. රන්, බොක්සයිට්, දියමන්ති, තඹ, නිකල්, මැන්ගනීස්, කොල්ටන් සහ යුරේනියම් සැලකිය යුතු තැන්පතු සමඟ ලොව විශාලතම ප්‍රත්‍යක්ෂ කරන ලද තෙල් සංචිත වෙනිසියුලාව සන්තකව ඇත. මෙම සම්පත් පාලනය කිරීම එක්සත් ජනපද මූල්‍ය ප්‍රාග්ධනයේ සහ තෙල් සංගත ප්‍රධානීන්ගේ මූලෝපායික අරමුණුවලට කේන්ද්‍රීය වේ. ට්‍රම්ප් කොල්ලකාරී චේතනාව පැහැදිලි කරමින් ප්‍රකාශ කළේ, “ලෝකයේ ඕනෑම තැනක වේවා විශාලතම එවා වූ එක්සත් ජනපද තෙල් සමාගම් රට තුලට ඇතුළු වී ඩොලර් බිලියන ගණනක් වියදම් කරනු ඇත” ලෙසය. [2] වාර්තා වන පරිදි, ට්‍රම්ප් ප්‍රහාරය සිදුවීමට පෙර තෙල් සංගත විධායකයින් ඒ පිළිබඳව දැනුවත් කළ අතර, කොංග්‍රසයෙන් සහ ඇමරිකානු

ජනතාවගෙන් තොරතුරු හිතාමතාම සඟවා ගත්තේය.

මෙම මෙහෙයුමේ අරමුණ වන්නේ ලතින් ඇමරිකාව තුළට චීනයේ සහ රුසියාවේ ගැඹුරු වන ආර්ථික විනිවිදීම ආපසු හැරවීමයි. අන්තර්වාර ජනාධිපති ඩෙල්සි රොඩ්‍රිගස් වෙත එක්සත් ජනපදය කළ බලකිරීම් මගින් භූ දේශපාලනික අරමුණු හෙළි විය: වෙනිසියුලාව "චීනය, රුසියාව, ඉරානය සහ කියුබාව පන්නා දමා ආර්ථික සබඳතා බිඳ දැමිය යුතුය", ඉන්පසු "තෙල් නිෂ්පාදනය සම්බන්ධයෙන් එක්සත් ජනපදය සමඟ පමණක් හවුල් වීමට සහ බර බොරතෙල් (heavy crude) අලෙවි කිරීමේදී ඇමරිකාවට අනුග්‍රහය දැක්වීමට එකඟ විය යුතුය." [3] රාජ්‍ය ලේකම් මාර්කෝ රුබියෝ මෙය පැහැදිලිවම රාමුගත කළේය: "චීනයට ඔවුන්ගේ තෙල් අවශ්‍ය වන්නේ ඇයි? රුසියාවට ඔවුන්ගේ තෙල් අවශ්‍ය වන්නේ ඇයි? ඔවුන් මේ මහාද්වීපයේවත් නැහැ. මෙය බටහිර අර්ධගෝලයයි."[4] එබැවින් ආක්‍රමණය සෘජු කොල්ලකෑම හරහා අතිරික්ත වටිනාකම් හඹා යෑම සහ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ පද්ධතිමය අර්බුදයෙන් ජනනය වන තියුණු වන භූ-දේශපාලනික එදිරිවාදිකම් යන දෙකම ප්‍රකාශ කරයි.

මෙම අර්බුදයට ගැඹුරු ඓතිහාසික මූලයන් ඇත. ලෙනින් විසින් අධිරාජ්‍යවාදය, ධනවාදයේ ඉහළම අවධිය තුළ විශ්ලේෂණය කළ පරිදි, අමුද්‍රව්‍ය ප්‍රභවයන් , ආයෝජන අවස්ථා සහ වෙළඳපොළවල් සුරක්ෂිත කර ගැනීමට ඒකාධිකාරී ප්‍රාග්ධනයේ (monopoly capital) ධාවනය ප්‍රතිවාදී බලවතුන් අතර ලෝකය ප්‍රචණ්ඩ ලෙස නැවත බෙදා ගැන්මට හේතු වේ. වත්මන් කාල පරිච්ඡේදය මෙම ක්‍රියාවලිය උග්‍ර ස්වරූපයෙන් අත්දකී: දශක ගණනාවක මූල්‍යකරණය, ණය ප්‍රසාරණය සහ සීමාව ඉක්මවූ සමපේක්ෂනය, ධනවාදයේ මූලික ප්‍රතිවිරෝධතාව—ලාභ රේට්ටුව පහත වැටීමේ ප්‍රවණතාවය—විසඳීමට අසමත් වී ඇත. 1970 ගණන්වල අග භාගයේ සිට නිෂ්පාදනයේ භූගෝලීයකරණය, ලාභ ශ්‍රමය සහ මූලෝපායික භූමි ප්‍රදේශ වෙත ප්‍රවේශ වීම මත පදනම් වූ තාවකාලික ප්‍රතිචාරයක් නියෝජනය කළ නමුත්, ඇමරිකානු අධිරාජ්‍යවාදය බාදනය වන තම ආර්ථික ආධිපත්‍යයට සහ ප්‍රතිවාදී බලවතුන්ගෙන් තීව්‍ර වන තරඟකාරීත්වයට මුහුණපා සිටිද්දී එම රාමුව දැන් බිඳ වැටෙමින් පවතී.

**නෛතිකභාවයේ මවාපෑමේ සිට බලය පිළිබඳ "අයෝමය නීතිය" දක්වා**

මෙම ප්‍රහාරයෙන් සංකේතවත් වන්නේ, පැරණි යටත් විජිත, ඒවායේ සම්පත් සහ ලාභ ශ්‍රමය ආදියේ 'සාමකාමී' නව-යටත් විජිතමය කොල්ලය සඳහා අන්තර්-අධිරාජ්‍යවාදී සමථය වෙනුවෙන් සේවය කළ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති සම්මතයන්, ස්වෛරීභාවයේ ආරක්ෂාවන්, රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාවලිය වැනි පශ්චාත්-යුධ නීතිමය සීමාවන් ඇමරිකානු අධිරාජ්‍යවාදය විසින් අතහැර දැමීමයි. ඓතිහාසිකව, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය කිසි විටෙකත් මෙම ජාත්‍යන්තර සීමාවන්ගෙන් සීමා වීමට කැමති වූයේ නැත. අද දින එක්සත් ජනපද පරිපාලන නිලධාරීහු එවැනි සීමාවන් පෙර නොවූ විරූ විවෘතභාවයකින් බැහැර කරති. නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී (Deputy Chief of Staff) ස්ටීවන් මිලර්, ජාත්‍යන්තර නීතිය හුදෙක් "ජාත්‍යන්තර ආචාරශීලී චර්යාවන්" ලෙස බැහැර කරමින් ප්‍රකාශ කළේ: "අපි ජීවත් වන්නේ ශක්තියෙන් පාලනය වන, බලහත්කාරකමින් පාලනය වන, බලයෙන් පාලනය වන ලෝකයකයි" ලෙසය. [5] මිලර් පැහැදිලිවම පැවසුවේ "ඇමරිකා එක්සත් ජනපදය වෙනිසියුලාව පාලනය කරයි... අපි බලයේ සිටින්නේ, එක්සත් ජනපද හමුදාව රටින් පිටත රඳවා ඇති බැවිනි. සීමාවන් සහ කොන්දේසි අපි පනවමු." [6]

මෙය නියෝජනය කරන්නේ සීමාව ඉක්මවවූ වාචාල කියුම් නොව මිලිටරි මෙහෙයුම් හරහා පනවන ලද රජයේ මූලධර්මයි. මිලර්ගේ සූත්‍රගත කිරීම්, "ජන වර්ගයන් සහ ජන වාර්ගික-රාජ්‍ය ගැටුම් සම්බන්ධව 'සොබාදහමේ යකඩ නීති' පිළිබඳ හිට්ලර්ගේ මෙයින් කැම්ප් (Mein Kampf) කෘතියෙන් උපුටා ගන්නා ලද නාසීන්ගේ භාෂාවයි" යනුවෙන් WSWS නිවැරදිව විස්තර කළේය.[7] දැනට සිටින රාජ්‍ය නායකයෙකු වන මදුරෝව—ඔහුගේ අනන්‍යතා ප්‍රකාශය සම්පූර්ණ කිරීමට පවා අවස්ථාව ප්‍රතික්ෂේප කර "යුද සිරකරුවෙකු" ලෙස ප්‍රකාශයට පත් කර මාංචු දමා—ෆෙඩරල් අධිකරණය ඉදිරියට ප්‍රදර්ශනයේ ගෙනයාමේ මෑන්හැටන් සංදර්ශනය ස්වෛරී ජාතියක් අවමානයට ලක් කරන අතරම ව්‍යාජ නීතිමය රංගනයක් හරහා පැහැර ගැනීම නීත්‍යානුකූල කිරීම අරමුණු කරයි. [8]

අන්තර් අධිරාජ්‍යවාදී එදිරිවාදිකම් නියාමනය කිරීමට සහ නව යටත් විජිත සූරාකෑම සඳහා නීත්‍යානුකූලභාවයේ ආවරණයක් සැපයූ පශ්චාත්-යුධ ආයතන, උග්‍ර ධනේශ්වර අර්බුදයක තත්වයන් යටතේ, කොල්ලකෑමට බාධාවක් බවට පත්ව ඇත. එම පිළිවෙල බිඳ වැටී ඇත. මොන්රෝ මූලධර්මයේ රූස්වෙල්ට් අනුෂංගය විස්තාපනය කරන, "ඩොන්රෝ මූලධර්මය" ලෙස ට්‍රම්ප් හඳුන්වන දෙය ඔහු විසින් කැඳවුම් කිරීම සහ "මෙය අපගේ අර්ධගෝලය යි" යන ඔහුගේ ප්‍රකාශය වොෂින්ටනය ලතින් ඇමරිකාව යටත් විජිත දේපළක් ලෙස සලකන බව පැහැදිලි කරයි. ග්‍රීන්ලන්තය සම්බන්ධයෙන් නේටෝ මිත්‍ර රටක් වන ඩෙන්මාර්කයට පවා තර්ජනය කිරීමට ඇති කැමැත්ත සහ වෙනිසියුලාවෙන් විදේශීය ආර්ථික හවුල්කරුවන් නෙරපා හැරීමට පැහැදිලි ලෙස නියෝග කිරීම සමඟ, එක්සත් ජනපද කතිපයාධිකාරය දැන් නීතිමය සීමාවන් පසෙකට දැමිය යුතු බාධක ලෙස සලකන බව පෙන්නුම් කරයි. ඇමරිකානු ප්‍රතිපත්ති, නග්න අධිරාජ්‍යවාදී අවශ්‍යතා හැර වෙනත් මූලධර්ම මගින් හැඩගස්වා ඇති බවට දිගු කලක් තිස්සේ පැවති ප්‍රබන්ධය දැන් එළිපිටම පසෙකට දමා ඇත.

**දිග් ගැස්සුනු ආක්‍රමණ මත ගොඩනැගූ ප්‍රහාරක උත්සන්න කිරීමක්**

බටහිර අර්ධගෝලය "ඇමරිකානු බලපෑම් ක්ෂේත්‍රයක්" ලෙස පැහැදිලිව නම් කර, ඒ තුළ "අර්ධගෝලයෙන්

බාහිර බලවතුන්ගේ” ඕනෑම මැදිහත්වීමක් වොෂින්ටනය විසින් ප්‍රතික්ෂේප කරනු ඇති බව ප්‍රකාශ කළ දෙසැම්බර් 2025 ජාතික ආරක්ෂක මූලෝපාය නිකුත් කිරීමෙන් කෙටි කලකට පසුව වෙනිසියුලාවට මෙම ප්‍රහාරය එල්ල විය. මෙම මූලෝපායික ලේඛනය චීනය ප්‍රධාන සතුරා ලෙස හඳුනා ගත් අතර, ලතින් ඇමරිකාව සහ මැද පෙරදිග පුරා මූලෝපායික සම්පත් තමන් සඳහා සුරක්ෂිත කිරීමෙන් “බලශක්ති ආධිපත්‍යය” මත එක්සත් ජනපද මිලිටරි පාලනය තහවුරු කිරීම අවධාරණය කළේය. වෙනිසියුලානු මැදිහත්වීම මෙම මූලධර්මයේ සමාරම්භක ක්‍රියාත්මක කිරීම නියෝජනය කරයි.

මධුරෝ පැහැර ගැනීම හමුදා පීඩනයේ සහ ආර්ථික ගෙල සිර කිරීමේ අඛණ්ඩ ව්‍යාපාරයක් සම්පූර්ණ කළේය. 2025 පුරාම, එක්සත් ජනපදය කැරිබියන් මුහුදේ දැවැන්ත නාවික හමුදාවක් එක්රැස් කර, වෙනිසියුලානු යාත්‍රාවලට නැවත නැවතත් මාරාන්තික ප්‍රහාර එල්ල කර, තෙල් ප්‍රවාහන නෞකා අල්ලා ගත් අතර, ක්‍රියාකාරී නාවික නිරෝධායනයක් පැනවීය—මේවා යුද ක්‍රියා වූවා මෙන්ම සැබෑ ලෙස ම වටලෑමක් (blockade) විය. 2025 දෙසැම්බර් අග දී, CIA සංවිධානය වෙනිසියුලානු භූමියට පළමු ප්‍රහාරය එල්ල කළේ වරාය පහසුකමක් ඉලක්ක කර ගනිමිනි. ජනවාරි මුල වන විට, හමුදා රැස්කිරීම කූටප්‍රාප්තියට පැමිණ තිබූ අතර, විශේෂ බලකායන් මධුරෝගේ වාස භූමියේ ආකෘති භාවිතා කරමින් ප්‍රහාරය පෙරහුරු කළහ; ට්‍රම්ප් නත්තලට පෙර අවසන් මෙහෙයුම අනුමත කළේය.

මෙම ගමන් පථය හිතාමතාම සිදු කළ ප්‍රහාරාත්මක උත්සන්න කිරීමේ ඉණිමඟක් ඉහළට ගමන් කළේය: මදුරෝ විසින් කළමනාකරණය කිරීමට උදව් කළ සහ මුදුනේ සිට මෙහෙයවන ලද බවට රාජ්‍ය දෙපාර්තමේන්තුව චෝදනා කළ “සූර්යයන්ගේ කාටලය” විදේශ ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කිරීම, මදුරෝගේ පවුල සහ තෙල් නැව්ගත කිරීම් ඉලක්ක කරගත් සම්බාධක පුළුල් කිරීම, 2007 දී එක්සත් ජනපද සමාගම් වලින් අත්පත් කරගත් ජනසතු කළ වත්කම් ආපසු ලබා දෙන ලෙස බල කිරීම සහ අවසානයේ සෘජු මිලිටරි ප්‍රහාරය. විපක්ෂයට මහජන සහයෝගයක් නොමැතිකම හේතුවෙන් දේශපාලන කුමන්ත්‍රණයක් මෙහෙය වීමට ගත් උත්සාහයන් අසාර්ථක වීමෙන් පසුව පමණක් සෘජු මිලිටරි මැදිහත්වීමක් මගින් සිදු කරන ලද පාලන තන්ත්‍ර වෙනසක් සහ සම්පත් අත්පත් කර ගැනීම සඳහා ක්‍රමානුකූල සූදානම මෙම රටාවෙන් හෙළි වේ.

**ධනේශ්වර ජාතිකවාදයේ බංකොලොත්භාවය සහ රෝස උදම් රැල්ල**

මෙම වැටලීම මගින් ලතින් ඇමරිකාවේ ජාතික ධනේශ්වරයේ පන්ති ස්වභාවය සහ දේශපාලන බංකොලොත්භාවය ශල්‍යකර්ම නිරවද්‍යතාවයෙන් හෙළිදරව් විය. බ්‍රසීලයේ ලූලා ද සිල්වා, මෙක්සිකෝවේ ක්ලෝඩියා ෂයින්බෝම්, කොලොම්බියාවේ ගුස්ටාවෝ පෙට්‍රෝ සහ අනෙකුත් “රෝස උදම් රැල්ල” (“Pink Tide”) නායකයින්, අධිරාජ්‍යවාදයෙන් බිඳී යාමෙන් හෝ මහජන විරෝධය බලමුලු ගැන්වීමෙන් ප්‍රවේශමෙන් වැළකුණු ඇල්මැරුණු හෙලාදැකීම් ඉදිරිපත් කළහ. WSWS ලේඛනගත කළ පරිදි, “ඇමරිකාව වෙනිසියුලාව ආක්‍රමණය කිරීම කෙරෙහි ලතින් ඇමරිකානු ධනේශ්වරයේ සියලුම කොටස්වල කුණු වූ සහ ප්‍රතිගාමී ප්‍රතිචාරය, අධිරාජ්‍යවාදී යුගයේ සියලු ජාතිකවාදී ඉදිරිදර්ශනවල අප්‍රමාණවත් බව පිළිබඳ සාක්ෂියක් ලෙස කම්කරු පන්තිය විසින් ගත යුතුය.”[9]

දකුණු ආසියාව පුරාම ද බියගුලුකමේ සහ පාවාදීමේ මෙම එකම රටාව ඉස්මතු විය. ශ්‍රී ලංකාවේ, ජනතා විමුක්ති පෙරමුණ (ජේවීපී) ජනවාරි 4 වන දින එක්සත් ජනපද ප්‍රහාරය හෙළා දකිමින් සහ ස්වෛරීභාවය පිළිබඳ “මෙම මූලධර්මය බලවත් රටවලට උල්ලංඝනය කිරීමට අයිතියක් නැත” යනුවෙන් ප්‍රකාශයක් නිකුත් කළ අතර, ජාතික ජන බලවේග (එන්පීපී) රජය කැපී පෙනෙන ලෙස වෙනස් ස්ථාවරයක් ගත්තේය. ජේවීපී දේශපාලන මණ්ඩල සභිකයෙකු වන විදේශ අමාත්‍ය විජිත හේරත්, පක්ෂය සහ එන්පීපී රජය අතර පැහැදිලිව බෙදුම් කඩනයක් සිදු කරමින්, “දේශපාලන පක්ෂවලට තමන්ගේම මත තිබිය හැකි” අතර, රජය “සියලු පාර්ශවයන් නියෝජනය කරන” බවත් එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණයන් හරහා ක්‍රියා කළ යුතු බවත් ප්‍රකාශ කළේය. විදේශ අමාත්‍යාංශ නිල ප්‍රකාශය, ආක්‍රමණිකයා නම් කිරීම හෝ මහජන විරෝධය බලමුලු ගැන්වීම ප්‍රතික්ෂේප කරන රාජ්‍ය තාන්ත්‍රික මගහැරීමේ භාෂාවෙන්, “සංවාදය” සහ “සාමකාමී විසඳුමක්” ඉල්ලා සිටින අතර “ගැඹුරු කනස්සල්ලක්” ප්‍රකාශ කළේය. මෙම භේදය ධනේශ්වර ජාතිකවාදී පාලනයේ හදවතේ ඇති මූලික ප්‍රතිවිරෝධතාව හෙළි කරයි: වරක් අධිරාජ්‍ය විරෝධී ලෙස පෙනී සිටි පක්ෂය දැන්, අධිරාජ්‍යවාදී ආර්ථික හා මිලිටරි සැකසුම් වලට එහි ඒකාබද්ධතාවය අනතුරේ හෙළනු ඇතැයි යන බිය දරා ගනිමින් වොෂින්ටනය සහ නවදිල්ලිය සමඟ ආරක්ෂක සහයෝගිතා ගිවිසුම් ආරක්ෂා කරයි.

ඉන්දියාවේ මෝදි රජය ඊටත් වඩා අන්ත වහල්භාවයක් පෙන්නුම් කළේය. ප්‍රහාරයෙන් පැය 24 කට වඩා පසු විදේශ කටයුතු අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කරමින් “ගැඹුරු කනස්සල්ල” ප්‍රකාශ කළ නමුත් එක්සත් ජනපදය නම් කිරීම හෝ හමුදා ප්‍රහාර හෙළා දැකීම කැපී පෙනෙන ලෙස මග හැරියේය. ජනවාරි 04 වන දින ඉන්දියාවේ ප්‍රතිචාරය වොෂින්ටනය නම් කිරීමෙන් ප්‍රවේශමෙන් වැළකී, ඒ වෙනුවට “සංවාදය හරහා සාමකාමීව ගැටළු විසඳා ගැනීමට අදාළ සියලු දෙනාටම” නොපැහැදිලි ලෙස ඉල්ලා සිටියේය. මෝදි රජයේ ගණනය කිරීම විනිවිද පෙනෙන සුළුය: ට්‍රම්ප් සමඟ වෙළඳ සාකච්ඡා, ONGC (ඉන්දීය රජය සතු විශාල තෙල් සමාගම) වෙත ගෙවිය යුතු වෙනිසියුලානු තෙල් ගෙවීම් සඳහා විභව ප්‍රවේශය සහ වොෂින්ටනය සමඟ මූලෝපායික හවුල්කාරිත්වය අධිරාජ්‍යවාදී ආක්‍රමණයට එරෙහි ඕනෑම ප්‍රතිපත්තිමය විරුද්ධත්වයකට වඩා ප්‍රමුඛත්වය ගනී.

පකිස්ථානයේ මිලිටරි ආධිපත්‍යය දරන තන්ත්‍රය සහ බංග්ලාදේශයේ එක්සත් ජනපදයේ සහාය ලත් අන්තර්කාලීන රජය, කිසිදු හෙළා දැකීමේ ප්‍රකාශයක් ඉදිරිපත් නොකර, පුරෝකථනය කළ හැකි නිහඬතාවයක් පවත්වා ගත්හ. දකුණු ආසියාව පුරා, ධනේශ්වර ජාතිකවාදී පක්ෂ සහ ආණ්ඩු—ඒවා වාම-ප්‍රගතිශීලී, හින්දු-ස්වෝත්තමවාදී හෝ ඉස්ලාම්වාදීන් ලෙස පෙනී සිටියත්—අධිරාජ්‍යවාදයේ නිරුවත් බලය ප්‍රකාශ කිරීමට මුහුණ දුන් විට එයට එරෙහි වීමට ඔවුන්ගේ ඓන්ද්‍රීය නොහැකියාව පෙන්නුම් කළහ.

මෙය ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලවය පිළිබඳ න්‍යාය සහ පරායත්ත රටවල ජාතික ධනේශ්වර පන්තියට අධිරාජ්‍ය විරෝධී හෝ ප්‍රජාතන්ත්‍රවාදී කාර්යයන් ඉදිරියට ගෙන යාමට ඇති නොහැකියාව පිළිබඳ ඔහුගේ විශ්ලේෂණය සනාථ කරයි. ප්‍රතිඵල සහ ශක්‍යතා (Results and Prospects -1906) සහ නොනවතින විප්ලවය (The Permanent Revolution-1928) යන කෘති තුළ, පසුගාමී රටවල ධනවාදයේ ප්‍රමාද වූ සංවර්ධනය, අධිරාජ්‍යවාදයට සහ ඉඩම් හිමි දේපළට ඓන්ද්‍රීයව බැඳී ඇති ධනේශ්වරයක් නිපදවන බවත්, එම පන්තිය ස්වාධීන කම්කරු පන්ති බලමුලු ගැන්වීමට බිය වන බවත්, එබැවින් විදේශ ආධිපත්‍යයට එරෙහිව අරගලයට නායකත්වය දීමට නොහැකි බවත් ට්‍රොට්ස්කි පෙන්නුම් කළේය. රෝස උදම් රැල්ල නියෝජනය කරන්නේ ලතින් ඇමරිකානු ධනේශ්වර ජාතිකවාදයේ ගැලපී ගැනීමේ (accommodation) සහ පාවාදීමේ ඉතිහාසයේ නවතම පරිච්ඡේදය පමණි.

දක්ෂිණාංශික සහ ෆැසිස්ට් ආන්ඩු තවත් ඉදිරියට ගොස්, ප්‍රහාරය විවෘතව සැමරූහ. 2023 ජනවාරි 8 වන දින බ්‍රසීලියාවේ කුමන්ත්‍රණ උත්සාහයේ නිර්මාපකයින් වූ බ්‍රසීලියානු අන්ත දක්ෂිණාංශිකයෝ, අලුතින් වාසිදායක ජාත්‍යන්තර තත්වයන් යටතේ තමන්ගේම ඒකාධිපති අරමුණු ඉදිරියට ගෙන යාම සඳහා මෙහෙයුම අල්ලා ගත්හ. කොලොම්බියානු ජනාධිපති පෙට්‍රෝට එරෙහිව ට්‍රම්ප්ගේ තර්ජන—"ඔහු තම පශ්චාත් භාගය ප්‍රවේශම් කරගත යුතුය" —සහ කියුබාව සහ නිකරගුවාව ඔහුගේ පරිපාලනය ඉදිරියේ "නොනැසී පවතිනු නැත" යන ප්‍රකාශයන් සංඥා කරන්නේ වෙනිසියුලානු මෙහෙයුම අර්ධගෝලය පුරා අසීමිත ප්‍රචණ්ඩත්වය සඳහා පූර්වාදර්ශයක් ස්ථාපිත කරන බවයි.[10]

**ව්‍යාජ-වමේ ප්‍රති-විප්ලවවාදී භූමිකාව**

ජාත්‍යන්තර නීතිය, රාජ්‍ය තාන්ත්‍රික ආයතන හෝ ප්‍රතිවාදී ධනේශ්වර බලවතුන් සමග සන්ධාන තුළ අධිරාජ්‍යවාදයට එරෙහි විරෝධය ස්ථානගත කරන ව්‍යාජ-වාම ප්‍රවාහයන්, ප්‍රතිසංස්කරණවාදී පක්ෂ සහ රාජ්‍ය නොවන සංවිධාන වෛෂයිකව ප්‍රති-විප්ලවවාදී කාර්යභාරයක් ඉටු කරයි. ඔවුහු මහජන කෝපය ධනේශ්වර දේපළ සබඳතා සහ අධිරාජ්‍යවාදී ආධිපත්‍යයට මූලික වශයෙන් අත නොතබන බෙලහීන ආයාචනා සහ ජාතික මූලෝපායන් වෙතට තල්ලු කරති.

ජර්මනියේ වාම පක්ෂය (Left Party) මෙම ප්‍රවණතාවය නිදර්ශනය කළේය. ට්‍රම්ප්ගේ ක්‍රියා "රාජ්‍ය ත්‍රස්තවාදය" ලෙස රූපිකව හෙළා දකින අතරම, තම විවේචනය යොමු කළේ අධිරාජ්‍යවාදයට එරෙහිව නොව, යුරෝපය තමන්ගේම මහා-බලවත් අභිලාෂයන් වඩාත් ආක්‍රමණශීලී ලෙස ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටීම දෙසට ය. WSWS විශ්ලේෂණය කළ පරිදි, වාම පක්ෂය "චාන්සලර් මර්ස් විවේචනය කරන්නේ වමේ සිට නොව දකුණේ සිට" ය. එය, එක්සත් ජනපදයට එරෙහිව සම්බාධක පැනවීමට සහ ඇමරිකානු ක්‍රියාමාර්ගවලට එරෙහිව "සංයුක්ත යුරෝපීය සැලැස්මක්" කැඳවුම් කරමින්, එමඟින් "ජර්මානු සහ යුරෝපීය අධිරාජ්‍යවාදය සඳහා ආක්‍රමණශීලී ක්ෂමාලාපකයින්" ලෙස ක්‍රියා කළේය.[11] ජාත්‍යන්තරව ව්‍යාජ-වාම සංවිධාන හරහා සමාන රටා පෙන්නුම් කළ අතර, ඒ සෑම එකක්ම තමන්ගේ ජාතික ධනේශ්වරයේ භූ දේශපාලනික අවශ්‍යතාවලට කම්කරු පන්තියේ විරෝධය යටත් කළේය.

ධනේශ්වර ආයතනවලට ආයාචනා කිරීම හරහා අධිරාජ්‍යවාදය මැඩපැවැත්විය හැකි බවත්, "බහු ධ්‍රැවීය" ධනවාදී තරඟය ප්‍රගතිශීලී විකල්ප ඉදිරිපත් කරන බවත්, අනන්‍යතා දේශපාලනය හෝ ප්‍රතිසංස්කරණවාදී පාර්ලිමේන්තුවාදය ස්වාධීන පන්ති අරගලය වෙනුවට ආදේශ කළ හැකි බවත් ලෙස මෙම ප්‍රවනතා මාරාන්තික මිත්‍යාවන් ප්‍රචාරය කරයි. ලෝක සමාජවාදී වෙබ් අඩවිය අවධාරණය කළ පරිදි, "යුද්ධයට එරෙහි අරගලය එහි හේතුවට—එනම් ධනවාදය—එරෙහි අරගලයට වෙන් කළ නොහැකි ලෙස බැඳී ඇත. පෞද්ගලික ලාභයට නොව සමාජ අවශ්‍යතා මත සමාජය ප්‍රතිසංවිධානය කිරීමට ධනවාදය ජය ගැනීම සඳහා ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමේ අරමුණින් කම්කරු පන්තිය විසින් එය මෙහෙයවිය යුතුය."[12]

**දේශීය මානය: විදේශයන්හි යුද්ධය, රට තුළ ඒකාධිපතිත්වය**

විදේශයන්හි මිලිටරිවාදයට හැරීම දේශීය වශයෙන් ඒකාධිපතිත්වය තහවුරුකිරීම හා වෙන් කළ නොහැකි ලෙස සමගාමී වේ. WSWS මෙම අත්‍යවශ්‍ය සම්බන්ධතාවය හඳුනා ගත්තේය: "මඩුරෝ පැහැරගැනීමේදී ප්‍රකාශිත වන එම අනීතික බව, එම අනුකම්පා විරහිත බව, එම අපරාධකාරී බව, රට තුල ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට පහර දීම්—සමූහ පිටුවහල් කිරීම්, මාධ්‍යයට පහරදීම්, සිවිල් සේවයෙන් පහ කිරීම්, ජනගහනයට එරෙහිව හමුදාව යෙදවීම—මඟින් ප්‍රකාශ වේ."[13] අනවරත යුද්ධයන්ට මුදල් සපයන අතර ඒවා පොලිස් රාජ්‍ය ක්‍රියාමාර්ග නීත්‍යානුකූල කිරීමට යොදා ගන්නා අතරම සමාජ කෝපය පාලක පන්තියට එරෙහිව නොව පිටතට යොමු කරයි.

මෙම රටාව කතිපයාධිකාරයේ වෛෂයික අවශ්‍යතාවය පිළිබිඹු කරයි. මාක්ස් පෙන්නුම් කළ පරිදි ධනවාදයේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධතා, බාහිර ප්‍රසාරණය සහ අභ්‍යන්තර මර්දනය යන දෙකම ජනනය කරයි. "වංචාව, සමපේක්ෂනය සහ කොල්ලකෑම හරහා

ISSN 3093-6217

තම ධනය රැස් කරගත් සාපරාධී කතිපයාධිකාරයක් ට්‍රම්ප් නියෝජනය කරයි...ඇමරිකානු පාලක පන්තියේ මෙම තෝරාගත් මෙවලම, ප්‍රජාතන්ත්‍රවාදී හෝ නීතිමය ක්‍රම මගින් තවදුරටත් ක්‍රියාත්මක කළ නොහැකි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා කතිපයාධිකාරිය විසින් වමනය කරන ලද මැරයෙකි."[14] එකවර වෙනිසියුලාවට පහර දීම සහ දේශීය වශයෙන් ඒකාධිපති පියවර වේගවත් කිරීම, ගැඹුරු වන අර්බුදයට මුහුණ දෙන මූල්‍ය ප්‍රාග්ධනයේ ඒකාබද්ධ වූ පන්ති අවශ්‍යතා ප්‍රකාශ කරයි.

**විප්ලවීය කර්තව්‍යයන් සහ ඉදිරි මාවත**

වෙනිසියුලාවට එල්ල කරන ප්‍රහාරයෙන් පෙන්නුම් කරන්නේ අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහි සටන ධනවාදයට එරෙහි සටනෙන් වෙන් කළ නොහැකි බවයි. ආරක්ෂක පියවරයන් ගැනීම හදිසි වේ: මහා යුද විරෝධී ක්‍රියාමාර්ග බලමුලු ගැන්වීම, මිලිටරි සූදානමට විරුද්ධ වීම සඳහා සේවා ස්ථානවල ක්‍රියාකාරී කමිටු ගොඩනැගීම, විශේෂයෙන් එක්සත් ජනපද කම්කරුවන් සහ ඔවුන්ගේ ලතින් ඇමරිකානු පන්ති සහෝදර සහෝදරියන් අතර කම්කරුවන්ගේ සහයෝගීතාවයේ ජාත්‍යන්තර සබඳතා ඇති කිරීම ආදී ක්‍රියාමාර්ග ඒ අතර වේ.

නමුත් ආරක්ෂක පියවර විප්ලවවාදී ඉදිරිදර්ශනයට සම්බන්ධ විය යුතුය. බැංකු සහ බහුජාතික සමාගම් අත්පත් කර ගැනීම, කම්කරු කවුන්සිල සහ කම්කරු ආණ්ඩු පිහිටුවීම, ජාත්‍යන්තර සමාජවාදී විකල්පයක් මෙහෙයවීම සඳහා හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (හජාජාක) ශාඛා ගොඩනැගීම—මේවා සෑම තැනකම පීඩිත ජාතීන් සහ වැඩ කරන ජනතාවගේ එකම යථාර්ථවාදී ආරක්ෂාවයි. WSWS සඳහන් කළ පරිදි: "පිළිතුර විය යුත්තේ 2026 පන්ති අරගලයේ සහ සමාජවාදය සඳහා මහජන ව්‍යාපාරයක වර්ධනයේ වසරක් බවට පත් කිරීමයි. යුද්ධයට එරෙහි සටන එය උත්පාදනය කරන ධනේශ්වර ක්‍රමයට එරෙහි සටනකි." [15]

විප්ලවවාදී අරගලය සඳහා වෛෂයික කොන්දේසි අසාමාන්‍ය වේගයකින් පරිණත වෙමින් පවතී. එක්සත් ජනපදය පුරා, මදුරෝ පැහැර ගැනීම කර්මාන්තශාලා සහ සේවා ස්ථානවල කම්කරුවන් අතර පුළුල් කෝපයක් සහ සැලකිල්ලක් ඇති කර තිබේ. මෙම විරුද්ධත්වය ස්වාධීන පන්ති පදනම් මත සංවිධානය කළ යුතු අතර, ධනවාදයේ පාලනය සුරක්ෂිත කරන ධනේශ්වරයේ සහ ව්‍යාජ-වමේ සියලු කොටස් ප්‍රතික්ෂේප කළ යුතුය. ලතින් ඇමරිකානු කම්කරුවන් "තමන්ගේම" ජාතික ධනේශ්වරය දෙසට නොව අධිරාජ්‍යවාදය පෙරලා දැමීමේ ඒකාබද්ධ අරගලයකදී ජාත්‍යන්තරව ඔවුන්ගේ පන්ති සහෝදර සහෝදරියන් දෙසට නැඹුරු විය යුතුය.

මාක්ස්වාදී වැඩපිළිවෙලකින් සහ ජාත්‍යන්තර කමිටුව තුළ මූර්තිමත් වන ඓතිහාසික පාඩම් වලින් සන්නද්ධ වූ ජාත්‍යන්තර කම්කරු පන්තියේ සහ පීඩිත ජනතාවගේ ස්වාධීන දේශපාලන බලමුලු ගැන්වීම හරහා පමණක්, ම්ලේච්ඡත්වයට හා සමූලඝාතනයට ඇද වැටීම නැවැත්විය හැකි අතර ලෝක සමාජවාදී විප්ලවය හරහා සැබෑ මානව විමුක්තිය සඳහා කොන්දේසි නිර්මානය කළ හැකිය.

යොමුව:

[1] "Oppose Trump's criminal invasion of Venezuela! Release Maduro!" WSWS, 4 January 2026, <https://www.wsws.org/en/articles/2026/01/04/avdu-j04.html>

[2] "US imperialist bandits parade kidnapped Maduro in show trial," WSWS, 6 January 2026

[3] "Trump and Miller's 'iron law' of imperialist barbarism," WSWS, 7 January 2026, <https://www.wsws.org/en/articles/2026/01/07/erjx-j07.html>

[4] "After Venezuela attack: White House threatens Venezuelan acting president, Cuba and Greenland," WSWS, 5 January 2026, <https://www.wsws.org/en/articles/2026/01/05/crzb-j05.html>

[5] "Trump and Miller's 'iron law' of imperialist barbarism," WSWS, 7 January 2026

[6] Ibid.

[7] Ibid.

[8] "US imperialist bandits parade kidnapped Maduro in show trial," WSWS, 6 January 2026 , <https://www.wsws.org/en/articles/2026/01/06/zyve-j06.html>

[9] "Latin America's bourgeois governments bow to US attack on Venezuela," WSWS, 6 January 2026, <https://www.wsws.org/en/articles/2026/01/06/slwp-j06.html>

[10] "Oppose Trump's criminal invasion of Venezuela!" WSWS, 4 January 2026

[11] "After Trump's attack on Venezuela: Germany's Left Party supports European imperialism," WSWS, 7 January 2026, <https://www.wsws.org/en/articles/2026/01/07/sfqt-j07.html>

[12] Ibid.

[13] "Trump and Miller's 'iron law' of imperialist barbarism," WSWS, 7 January 2026

[14] Ibid.

[15] "Oppose Trump's criminal invasion of Venezuela!" WSWS, 4 January 2026

# ජෙන්-Z නැගිටීම් සහ නායකත්වයේ අර්බුදය: ‘නායකත්වයක් නොමැති’ ව්‍යාපාර සහ ‘වාම ජනතාවාදයට’ එරෙහිව නොනවතින විප්ලවය - 3 කොටස

**සංජය ජයසේකර** විසිනි.

*ජෙන්-Z විරෝධතාවල ගෝලීය රැල්ල, විප්ලවවාදී නායකත්වයේ ගැඹුරු වන අර්බුදය සහ ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යායේ පදනම මත සමාජවාදී ජාත්‍යන්තරවාදයේ වැඩපිළිවෙල සඳහා සටන් කිරීමේ අවශ්‍යතාවය විමර්ශනය කරන ලිපි මාලාවක 3 වන කොටසෙහි සිංහල පරිවර්තනය අපි මෙහි පළ කරමු. 2 කොටස ඉංග්‍රීසි බසින් theSocialist.lk වෙබ් අඩවියේ 2025 නොවැම්බර් 14 දින පළ කෙරුණි. 1 කොටස 2025 නොවැම්බර් 6 වන දින ඉංග්‍රීසි බසින්ද, නොවැම්බර් 10 දින සිංහල බසින් ද පළ කරන ලදී. 3 කොටස ඉංග්‍රීසි බසින් 2026 පෙබරවාරි 27 දින පළ විය.*

## ජෙන්-Z කැරලිවල පෙළපත: අරාබි වසන්තය, වෝල් වීදිය වඩිලෑම සහ කහ කබා උද්ඝෝෂණ—දේශපාලනය, උපායමාර්ග, වැඩ පිළිවෙළ සහ කම්කරු පන්තිය සඳහා පාඩම්

### අරාබි වසන්තය — ඓතිහාසික පූර්වගාමියා සහ දේශපාලන පාඩමක වස්තු විෂය

මැදපෙරදිග සහ උතුරු අප්‍රිකාවේ (MENA) 2010–2011 කාල වකවානුවේ සිදුවූ අරාබි වසන්තය (Arab Spring) මෙහිදී පරීක්ෂා කෙරෙන එකක් පසු එකක් ලෙස හටගත් පාර්ලිමේන්තුවෙන්-පිටත කැරලි රැල්ලට තීරණාත්මක ඓතිහාසික පූර්වගාමියා වූ අතර, එහි දේශපාලන පාඩම් සමස්ත පසුකාලීන ඉතිහාසයම විනිවිද යයි. එය තනි සමජාතීය ව්‍යාපාරයක් නොව, ලෝක ධනවාදයේ ව්‍යුහාත්මක අර්බුදය—ඉහළ යන අසමානතාවය, මහා විරැකියාව සහ බිඳ වැටෙන ජීවන තත්වයන් මගින් පිළිබිඹු වූ—මගින් මෙහෙයවන ලද මහා සමාජ නොසන්සුන්තාවයේ ගෝලීය පිපිරීමක් වූ අතර, එහි දේශපාලනය ගැඹුරින් ප්‍රතිවිරෝධී පන්ති බලවේගයන්ගේ ගැටුමින් හැඩගැසුණි: රැඩිකල් වන කම්කරු පන්තියක් සහ දුප්පතුන්, තරුණයින් සහ සුලු ධනේශ්වර ක්‍රියාකාරීන් විශාල ස්ථරයක්, දේශපාලන අවකාශයක් සහ වාසියෙන් වැඩි පංගුවක් සොයන මධ්‍යම පන්තියේ කොටස්, මිලිටරි කල්ලි සහ ඉස්ලාමීය පක්ෂ ඇතුළු ජාතික පාලක පන්තිවල තරඟකාරී කොටස් මේ පන්ති බලවේග අතර විය. ඒකාධිපති පාලන තන්ත්‍රයන්ට එරෙහි මහජන නැගිටීම් ලෙස ආරම්භ වූ දෙය වේගයෙන් විවිධ පන්ති බලවේග සහ ධනේශ්වර කන්ඩායම් තමන්ගේ අවශ්‍යතා සඳහා ප්‍රතිඵල හැඩගැස්වීමට සටන් කළ යුධ පිටියක් බවට පත්විය.



ජනාධිපති හොස්නි මුබාරක්ගේ ඉල්ලා අස්වීම නිවේදනය කිරීමෙන් පසු කයිරෝවේ තහ්රීර් චතුරශ්‍රයේ විරෝධතාකරුවෝ ප්‍රීති ඝෝෂා පවත්වති.

ඊජිප්තුවේ, මුස්ලිම් සහෝදරත්වය සහ මිලිටරි පිටුබලය ලත් ටැමරොඩ් (Tamarod) ව්‍යාපාරය යන දෙකම උත්සාහ කළේ මහජන කෝපය ස්වාධීන කම්කරු පන්තිය මගින් ධනේශ්වර රාජ්‍යය පෙරලා දැමීමක් වෙතට වඩා ඔවුන්ගේ අදාළ ධනේශ්වර ව්‍යාපෘතිවලට යොමු කිරීමට ය. ඊජිප්තු අත්දැකීම් පිළිබඳ WSWS විශ්ලේෂණය තහවුරු කළ පරිදි, ඊනියා ලිබරල් සහ ව්‍යාජ වාම සංවිධාන තීරණාත්මක ප්‍රතිවිප්ලවවාදී භූමිකාවක් ඉටු කළ අතර, කුමන්ත්‍රණ අණදෙන නිලධාරී ජෙනරාල් අබ්දෙල් ෆටා එල්-සිසි විසින් හමුදා අත්පත් කර ගැනීම—එය එම සංවිධාන යථාමය ලෙස සුදානම් කර තිබූ ප්‍රතිඵලයකි—නිවේදනය කරන විට ටැමරොඩ් නායකයින් ඔහුගේ පැත්තේ සිටගෙන සිටියහ.[1] වීදිවල ස්වයංසිද්ධව ඉදිරිපත් වූ දේශපාලන ඉල්ලීම්—පාන්/ආහාර, රැකියා, ගෞරවය, දූෂණයට අවසානයක්, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්—අව්‍යාජ සහ ගැඹුරු සමාජ අවශ්‍යතාවයක් ප්‍රකාශ කළ නමුත් සමාජ හා ප්‍රජාතන්ත්‍රවාදී ඉල්ලීම් ස්වයංක්‍රීයව සමාජවාදී වැඩසටහනක් අන්තර්ගත කර නොගනියි. සංවිධානාත්මක විප්ලවවාදී කම්කරු පන්ති නායකත්වය නොමැති තැන, ලිබරල්, ඉස්ලාමීය සහ සුලු ධනේශ්වර ධාරාවන් රික්තය පුරවා, සෑම අවස්ථාවකම ධනේශ්වර දේපළ සබඳතා සහ අධිරාජ්‍යවාදී ආධිපත්‍යය

ආරක්ෂා කරන විකල්ප වැඩසටහන් ඉදිරිපත් කළහ.

අරාබි වසන්තයේ කේන්ද්‍රීය ලක්ෂණයක් වූයේ එහි ස්වයංසිද්ධතාවයයි: එය හදිසි මහජන බලමුලු ගැන්වීම්, මහා වැඩවර්ජන සහ ගෝලීය වශයෙන් පාලක පන්ති භීතියට පත් කළ සහ පවතින සංවිධානවල සීමාවන් හරහා පුපුරා ගිය වාඩිලාගැනීම් වලින් සමන්විත විය. මෙම ස්වයංසිද්ධතාවය එකවරම ශක්තියක්–ස්වාධීනව සහ දැවැන්ත බලයකින් ක්‍රියා කිරීමට ජනතාවට ඇති හැකියාව පෙන්නුම් කිරීම–සහ නැගිටීම්වල විප්ලවවාදී විභවයට මාරාන්තික බව ඔප්පු කළ ව්‍යුහාත්මක සීමාවක් විය. විප්ලවවාදී කම්කරු පන්ති පක්ෂයක් නොමැතිව සහ කම්කරු පන්ති බලයේ අවයව නොමැතිව—කර්මාන්තශාලා කමිටු, ක්‍රියාකාරී කමිටු, නිවහන් පෙදෙස් කමිටු යන සංවිධාන ආකාර–මෙම ස්වයංසිද්ධ ව්‍යාපාර, වඩා හොඳින් සංවිධානය වූ ධනේශ්වර කන්ඩායම් විසින් අවශෝෂණය කර ගැනීම, වෙහෙසට පත් කිරීම සහ මර්දනය කිරීම හරහා අත්පත් කර ගැනීම මගින් බලමුලු හරනයට ගොදුරු විය හැකිය. 2011 පෙබරවාරියේ දී ඉදිරිපත් කරන ලද ඊජිප්තු නැගිටීම පිළිබඳ ඔහුගේ සමකාලීන විශ්ලේෂණයේ දී නික් බීම්ස් තර්ක කළ පරිදි, මහජන විප්ලවවාදී ශක්තිය රාජ්‍ය බලය බවට පරිවර්තනය කළ හැකි දේශපාලන හා සංවිධානාත්මක නායකත්වයක් කම්කරු පන්තියට නොමැති තැන හමුදාවට සහ ධනේශ්වර බලවේගවලට පාලනය නැවත තහවුරු කිරීමට හැකි විය.[2] මුබාරක් බලයෙන් පහ කළ වැඩ වර්ජන රළ තුළ, ඊජිප්තුව සතුව සමාජවාදී විප්ලවයක් කිරීමට වෛෂයික සමාජ බලය පැවතිණි; එයට නොතිබුනේ ආත්මීය මෙවලම, එනම් ජනතාව තුළ නැංගුරම් ලා ගත් ජාත්‍යන්තර සමාජවාදයේ ඉදිරිදර්ශනය සඳහා සටන් කරන විප්ලවවාදී පක්ෂයකි: එය නොමැතිව එම බලය එහි අවශ්‍ය අවසානයට යොමු කළ නොහැකි විය. දශකයක පසුකාලීන අත්දැකීම් මගින් සනාථ කරන ලද ප්‍රතිඵලය වූයේ විප්ලවය විසින් පෙරලා දැමූ පාලනයට වඩා කුරිරු හමුදා ආඥාදායකත්වයක් එල්-සිසි යටතේ ඇති කිරීමයි.

අරාබි වසන්තය, අධිරාජ්‍යවාදී මධ්‍යස්ථානයේ නිශ්චිත තත්වයන් තුළ වෝල් වීදිය වාඩි ලෑම Occupy Wall Street (2011) විසින් ප්‍රතිනිෂ්පාදනය කෙරුනු දේශපාලනික අන්තරායන් හෙළිදරව් කරන අතරම, වාඩි ලෑම මත ඍජු දෘෂ්ටිවාදාත්මක හා උපායමාර්ගික (tactical) බලපෑමක් ඇති කළේය. පොදු අවකාශ මහජනයා අත්පත් කර ගැනීම් සහ තිරස් (horizontal) රැස්වීම් මගින් පුළුල් මහජන අනුකම්පාවක් උත්ගත කළ හැකි බවට වූ විචිත්‍රවත් නිරූපණය, වෝලි වීදිය වාඩි ලෑමට එහි උපායමාර්ගික ආකෘතිය සහ එහි ආරම්භක දේශපාලන විශ්වාසය ලබා දුන්නේය. නමුත් අරාබි වසන්තය, ඇස් ඇති අයට, “නායකත්වයක් නොමැති” ස්වයංසිද්ධ ව්‍යාපාර ඒවා තුළ ගැබ් කර ගත් නිශ්චිත අවදානම ද හෙළි කළේය: සමාජවාදී වැඩසටහනක් සහ ස්වාධීන කම්කරු පන්ති සංවිධානයක් නොමැතිව, මහජන කැරැල්ල ක්‍රමානුකූලව ධනේශ්වර ආයතන හෝ ප්‍රතිසංස්කරණවාදී ආවෘත අන්ත වෙත නැවත යොමු කෙරේ.

2012 ඔබාමා මැතිවරණ ව්‍යාපාරයට, වෝල් වීදිය වාඩිලෑමේ ව්‍යාපාරය අවශෝෂණය කර ගැනීමට හිටපු වාමාංශික පුද්ගලයින් සහ ඩිමොක්‍රටික් පක්ෂ ක්‍රියාකාරීන් දැරූ උත්සාහයන් ලේඛනගත කරමින්, ලෝක සමාජවාදී වෙබ් අඩවිය මෙම අනතුර එම ව්‍යාපාරය බිහිවෙද්දීම හරියටම හඳුනා ගත්තේ, රටින් රටට අරාබි වසන්තයේ දේශපාලන ප්‍රතිඵල විකෘති කළ ධනේශ්වර නැවත අවශෝෂණය කිරීමේ (reabsorption) යාන්ත්‍රණය ලෙසයි.[3] අරාබි වසන්තය මතු කළ සහ වෝල් වීදිය වාඩි ලෑම විසඳීමට අපොහොසත් වූ මූලෝපායික ප්‍රශ්නය, 2022 සිට ජෙන්-Z ව්‍යාපාර මුහුණ දෙන ප්‍රශ්නයම විය: එනම්, මහජන විරෝධතා ධනේශ්වර දේශපාලනයේ රාමුව තුළ සංකේතාත්මක බාධා කිරීම් සහ දැනුවත්භාවය ඉහළ නැංවීම අරමුණු කර ගන්නේද, නැතහොත් ඒවා ප්‍රාග්ධනයේ ආර්ථික බලයට එරෙහිව සටන් කිරීමට සහ රාජ්‍ය බලය පිළිබඳ ප්‍රශ්නය මතු කිරීමට හැකියාව ඇති ස්වාධීන කම්කරු පන්ති සංවිධානයක්–මහා වැඩ වර්ජන, ක්‍රියාකාරී කමිටු, කර්මාන්ත අරගල සම්බන්ධීකරණය–ගොඩනැගීම දෙසට යොමු කර තිබේද යන්නයි. විප්ලවවාදී ජාත්‍යන්තරවාදී දෘෂ්ටි කෝණයකින්, ස්වයංසිද්ධ මහජන ශක්තිය සමාජවාදී දේශපාලන වැඩසටහනක් සහ කල් පවතින නිර්ධන පන්ති (කාර්මික) සංවිධානයක් බවට පරිවර්තනය කිරීමෙන් පමණක් පීඩිතයන්ගේ පුනරුත්ථාපනය වන කැරලිකාරිත්වය ධනේශ්වර පාලනය පෙරලා දැමිය හැකි බලවේගයක් බවට පරිවර්තනය කළ හැකිය.

**පොදු මූලයන්: ධනවාදයේ අර්බුදය සහ දේශපාලන සුජාතභාවයේ අර්බුදය**

වෝල් වීදිය වාඩිලෑමේ ව්‍යාපාරය, කහ කබා ව්‍යාපාරය (Yellow Vest Movement / Gilets Jaunes, 2018–2020) සහ ජෙන්-Z නැගිටීම්, අනුප්‍රාප්තික හා ගුණාත්මකව උත්සන්න වන පාර්ලිමේන්තු ක්‍රමයෙන් පිටත මහජන කැරැලිවල රැළි තුනක් වේ. ඒවා සම්බන්ධයක් නැති හෝ හුදෙක් අනුක්‍රමික සංසිද්ධි ලෙස සැලකීම යනු ඒවා පොදුවේ හෙළි කරන වැදගත්ම සත්‍යය මග හැරීමකි: මේ තුනම ලෝක ධනවාදයේ යටින් පවතින සහ ගැඹුරු වන එකම ප්‍රතිවිරෝධතාවයේ–එනම්, වඩ වඩාත් ඒකාබද්ධ වූ හා ගෝලීය පරිමාණයෙන් සංවිධානය වූ සමාජ නිෂ්පාදනය සහ එය, අතිමහත් බහුතරය අනාරක්ෂිතභාවයට, දරිද්‍රතාවයට සහ අවිනිශ්චිතභාවයට හෙළා දමමින් එන්න එන්නම අඩු වන පුද්ගල සංඛ්‍යාවක් අත ධනය සංකේන්ද්‍රණය කරන පුද්ගලික අයිතියට සහ ලාභයට යටත් කිරීමේ–ප්‍රකාශනයන් වේ.

සෑම රැල්ලක්ම පැන නැගුනේ එම පොදු අර්බුදයේ නිශ්චිත සංධිස්ථානයකිනි. 2007-2009 මූල්‍ය බිඳවැටීමට සහ ඔබාමා පරිපාලනයේ බැංකු ඇපකර වැඩසටහන හරහා වෝල් වීදියේ බලය නැවත තහවුරු කිරීමට වාඩිලෑම ප්‍රතිචාර දැක්වීය. මෙම ඇප දීම හරහා මූල්‍ය විනාශයේ නිර්මාතෘවරුන්ට

ට්‍රිලියන ගණන් මහජන අරමුදල් මාරු කරන ලද අතර කම්කරු පන්ති පවුල්වලට ඔවුන්ගේ නිවාස, රැකියා සහ ඔවුන්ගේ ඉතිරිකිරීම් අහිමි කෙරිණි. වාඩිලෑමේ ව්‍යාපාරය "මූලික ඓතිහාසික බලවේගය ලෙස පන්ති අරගලය නැවත මතුවන" බව ප්‍රකාශ කළ බවත්, එය "ලෝක ධනවාදයේ කේන්ද්‍රස්ථානය වන එක්සත් ජනපදයේ පන්ති අරගලයේ පුපුරන සුලු පිපිරීමක පෙරටු සේයාව" බවත් ලෝක සමාජවාදී වෙබ් අඩවිය එකල නිරීක්ෂණය කළේය. [4]

2018 නොවැම්බර් මාසයේදී කහ කබා විරෝධතා පුපුරා ගියේ, එමානුවෙල් මැක්‍රොන්ගේ ඉන්ධන බද්ද–බලශක්ති සංක්‍රාන්ති කිරීමේ (ෆොසිල ඉන්ධන වලින් ඉවතට) පිරිවැය සමාගම් වලින් කම්කරුවන් සහ පළාත් බද දුප්පතුන් මතට මාරු කිරීම සඳහා නිතාමතාම නිර්මාණය කරන ලද බද්දක්–පශ්චාත් දෘෂ්ටිවාදී (පන්ති දේශපාලනයේ සහ දෘෂ්ටිවාදාත්මක ගැටුමේ යුගය අවසන් වූ බව) තාක්ෂණික නවීකරණයක් ලෙස ඡන්දදායකයින්ට ඉදිරිපත් කරන ලද "En Marche" (මැක්‍රොන්ගේ මාධ්‍යමික, ලිබරල් දේශපාලන පක්ෂය) ව්‍යාපෘතියේ පන්ති ස්වභාවය නිසැකවම පෙන්නුම් කළ විටය.

නව ලිබරල් ප්‍රතිව්‍යුහගතකරණයේ වසර හතළිහක සුන්බුන්, COVID-19 හි විනාශය, යුක්රේනයේ එක්සත් ජනපද-නේටෝ ප්‍රොක්සි ගැටුමේ ආර්ථික යුද්ධය, පසුගාමී රටවල් පුරා IMF හි ණය-වහල්කමේ (debt-peonage) තන්ත්‍රය සහ ත්වරණය වන දේශගුණික අර්බුදය හේතුවෙන් බහු මහාද්වීප හරහා මිලියන සංඛ්‍යාත තරුණ තරුණියන්ට පැවැත්මම දේශපාලන ප්‍රශ්නයක් බවට එකවර පත් වූ විට, ජෙන්-Z රැල්ල පුපුරා ගියේය.

මෙම අරගලවල පොදු දේශපාලන ස්වභාවය ඒවා අතර පොදුවේ බෙදා ගැනුණු ද්‍රව්‍යමය මූලයන්ගෙන් සෘජුවම පැන නගී. නාමික "වාම" සහ දක්ෂිණාංශික යන ස්ථාපිත පක්ෂ සියල්ලක්ම සූරාකෑමට සමාන හවුල්කරුවන් ලෙස සැලකීමත්, දිගු කලක් පන්ති අරගලය කළමනාකරණය කර මැඩ පැවැත්වීම සිදුකළ වෘත්තීය සමිති නිලධරයන් සහ ආයතනික මැදිහත්කරුවන් සමඟත්, පාර්ලිමේන්තු දේශපාලනය සමඟත් මහජනයාගේ ගැඹුරු බිඳීමක් මෙම ත්‍රිත්ව විරෝධතා මගින් සටහන් කෙරුණි. වාඩිලෑමෙහි "සියයට 99ය අපි වෙමු", මාධ්‍ය කුට්වල "පැරිසියානු ප්‍රභූන්" කෙරෙහි කහ කබාකරුවන් ගේ කැකෑරෙන පිළිකුල, ජෙන්-Z ව්‍යාපාර විසින් ස්ථාපිත දේශපාලන සංයුතීන් ප්‍රතිසංස්කරණයෙන් ඔබ්බට දූෂිත යැයි සම්පූර්ණයෙන්ම බැහැර කිරීම යන මෙම සටන් පාඨ ප්‍රකාශ කරන්නේ දේශපාලන අපරිණතභාවය නොව, කිසිදු රූපලාවණ්‍ය ප්‍රතිසංස්කරණයකට හෝ රජයේ නිලධාරීන්ගේ වෙනසක් මගින් විසඳිය නොහැකි ධනේශ්වර දේශපාලන සුජාතභාවයේ අව්‍යාජ හා ගැඹුරු වන අර්බුදයකි.

**දේශපාලනය: සංස්ථාපිත විරෝධීවාදය, "දේශපාලනය එපා" සහ ජනතාවාදී උගුල**

ඒවායේ පොදු සංස්ථාපිත විරෝධී ස්වභාවය තිබියදීත්, මෙම අරගල රැලි තුන දේශපාලන සංයුතියේ සැලකිය යුතු වෙනස්කම් පෙන්නුම් කරන අතර, ඒවා අවිභින්න (undifferentiated) "නව සමාජ ව්‍යාපාර" කාණ්ඩයකට ලඝු කිරීම නොව නිශ්චිතව විශ්ලේෂණය කළ යුතුය.

**1. වෝල් වීදිය වාඩිලෑම: මධ්‍යම පාන්තික පෙරහුරුව**

ආරම්භයේ සිටම වාඩිලෑමේ ව්‍යාපාරය ආධිපත්‍යය දැරුවේ නිව්යෝර්ක්හි සුකෝට්ටි පාර්ක්, ඕක්ලන්ඩ්, බොස්ටන් සහ ලන්ඩනයේ සහ අනෙකුත් අධිරාජ්‍යවාදී නගරවල ඔවුන්ගේ සගයන් බඳු නාගරික මධ්‍යස්ථානවල සංකේන්ද්‍රණය වූ ප්‍රධාන වශයෙන් මධ්‍යම පාන්තික සමාජ කාණ්ඩ වලිනි. වාඩිලෑමේ ව්‍යාපාරය පැහැදිලිවම අරාබි වසන්තයෙන් ආභාෂය ලබා ගත් අතර, කැනේඩියානු ඇඩ්බස්ටර්ස් සඟරාවේ සංවිධායකයින් එය මෙසේ ප්‍රකාශ කළහ: "ඊජිප්තුවේ, ග්‍රීසියේ, ස්පාඤ්ඤයේ සහ අයිස්ලන්තයේ සිටින අපගේ සහෝදර සහෝදරියන් මෙන්, ඇමරිකාවේ ප්‍රජාතන්ත්‍රවාදය යථා තත්ත්වයට පත් කිරීම සඳහා විප්ලවීය අරාබි වසන්ත උපක්‍රමය භාවිතා කිරීමට අපි සැලසුම් කරමු."[ABCNews] ව්‍යාපාරයේ රූප සංඥාව (imagery)–කයිරෝවේ තහ්රීර් චතුරශ්‍රය ප්‍රතිරාවය කරන සුකෝට්ටි උද්‍යානය අත්පත් කර ගැනීම – සහ ඊජිප්තු විප්ලවයේ ජයග්‍රහණයෙන් මාස කිහිපයක් පසු පසින් පැමිණි එහි කාල නිශ්චය (timing) සෘජු පෙළපත් සම්බන්ධයක් (lineage) පිහිටු විය. ඒ කාලයේ ලෝක සමාජවාදී වෙබ් අඩවිය නිරීක්ෂණය



නිව්යෝර්ක් නගරයේ වාඩිලෑමේ විරෝධතා (රූපය wsws.org වෙතින්)

කරන ලද පරිදි , "ඊජිප්තුවේ විප්ලවවාදී නැගිටීම්වල සිට ඊශ්‍රායලයේ මහජන පෙලපාලි සහ යුරෝපයේ සමාජ පිපිරීම් දක්වා, පන්ති අරගලය මූලික ඓතිහාසික බලවේගය ලෙස නැවත මතුවී තිබේ."[5]

මෙම ව්‍යාපාරය මතු වූයේ අරාජිකවාදී සංවිධාන වලින් – විශේෂයෙන් කැනේඩියානු සඟරාවක් වන ඇඩ්බස්ටර්ස් වෙතින්–වන අතර, එය "විප්ලවවාදී අරාබි වසන්ත උපක්‍රමය" එහි සංවිධානාත්මක ආකෘතිය ලෙස පැහැදිලිවම යොදා ගත්තේ එම ආකෘතියේ පන්ති අන්තර්ගතය බැහැර කරමිණි. ජනප්‍රිය කතිපයාධිකාරී විරෝධී හැඟීම්වල ප්‍රකාශනයක් ලෙස කෙතරම් ආකර්ශනීය වුවත්, "සියයට 99" සටන් පාඨය දේශපාලනිකව නිර්මාණය කරනු ලැබුවේ, කම්කරු පන්තිය සහ වෝඩිලෑමේ නායකත්වය උකහා ගත් ධනවත් ඉහළ-මැද ස්ථරය අතර මූලික පන්ති බෙදීම තියුණු කිරීමට නොව වසං කිරීමට ය. [6]

මෙම පන්ති පදනමේ දේශපාලන ප්‍රතිවිපාක, ව්‍යාජ-වාම සංවිධාන, සියල්ලටත් වඩා ජාත්‍යන්තර සමාජවාදී සංවිධානය (ISO) විසින් ඉටු කරන ලද භූමිකාව තුළ දෘශ්‍යමාන විය. එහි නාමික සමාජවාදී වාචාලකම තිබියදීත්, ISO, වෝඩිලෑම AFL-CIO වෘත්තීය සමිති යන්ත්‍රණයට යටත් කිරීමට සහ එහි ශක්තිය බැරැක් ඔබාමාගේ 2012 නැවත මැතිවරණ ව්‍යාපාරයට යට කිරීමට ක්‍රමානුකූලව කටයුතු කළේය. සමකාලීන වාර්තාකරණයේ දී WSWS ලේඛනගත කළ පරිදි, ISO, "AFL-CIO සහ අනෙකුත් වෘත්තීය සමිති යාන්ත්‍රණවල පාලනය යටතට වෝඩිලෑම ගෙන ඒමට උදව් කිරීමෙන් විරෝධතා ව්‍යාපාරය යටපත් කිරීමට උත්සාහ කරයි". ඒ අතර, ඔවුහු, නොබෝ කලකට පෙර වෙරිසොන් වැඩ වර්ජනය පාවා දීමෙන් නැවුම්ව සිටි AFL-CIO සභාපති රිචඩ් ට්‍රම්කා සහ CWA හි බොබ් මාස්ටර් යන වෘත්තීය සමිති නිලධාරීන්ට ප්‍රශංසා කරමින්, කම්කරුවන් මත (හාම්පුතුන් සඳහා සහන සපයමින්) කප්පාදු පැනවීමේ ඔවුන්ගේ භූමිකාව සඟවා ගත්හ.[7]

"දේශපාලනය එපා" සහ "නායකත්වයක් එපා" යන්න ISO විසින් ප්‍රවර්ධනය කිරීම, ඩිමොක්‍රටික් පක්ෂය පැන පිරවීමට හදිසි වූ දේශපාලන රික්තය හරියටම නිර්මාණය කිරීමට උපකාරී විය. WSWS දුරදක්නා නිරවද්‍යතාවයකින් අනතුරු ඇඟවීය: "වෝල් වීදියේ විරෝධතාවලට සම්බන්ධ බොහෝ කණ්ඩායම් ස්පාඤ්ඤයේ සහ ග්‍රීසියේ *indignados* හි 'දේශපාලනය එපා' සහ නායකත්වයක් නොතිබිය යුතු බවට වන ස්ථාවරය ප්‍රතිරාවය කර ඇත. 'දේශපාලනය එපා' සඳහා වන ඉල්ලීම ධනේශ්වර දේශපාලනයට සහ ධනවාදී ද්වි-පක්ෂ ක්‍රමයට විරුද්ධ ප්‍රතිපත්තිගරුක සහ සංගත දේශපාලන විකල්පයක් – එනම්, සමාජවාදී දේශපාලනය–ප්‍රතික්ෂේප කිරීමකට සමාන වේ. එය දේශපාලන රික්තය පිරවීමට පියවර ගන්නා ඩිමොක්‍රටික් පක්ෂයේ වාසියට සෘජුවම ක්‍රියා කරයි." [8] හරියටම සිදු වූයේ මෙයයි. 2011 නොවැම්බර් මාසයේදී වෝඩිලෑමේ කඳවුරු විනාශ කළ සම්බන්ධීකෘත ෆෙඩරල්-ප්‍රාදේශීය පොලිස් මර්දනය– එෆ්බීඅයි, ස්වදේශ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය පොලිස් බලකායන් සම්බන්ධ වූ, බහු නගර හරහා ජාතික වශයෙන් සංවිධානාත්මක කල මෙහෙයුමක් ලෙස එය ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් ලේඛනගත කරන ලදී [9]–ධනවාදී පිළිවෙලට කිසිදු තිරසාර අභියෝගයක්–එය කෙතරම් කළලමය අවස්ථාවක වුවද–නොඉවසීමට පාලක පන්තියේ ස්ථිර අධිෂ්ඨානය හෙළි කළේය. ISO පසුව විසුරුවා හැරීම සහ එහි ප්‍රමුඛ කන්ඩායම ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන් (DSA- Democratic Socialists of America) තුළට අවශෝෂණය කර ගැනීම, ආරම්භයේ සිටම වෝඩිලෑමේ ව්‍යාපාරය තුළ එය අනුගමනය කළ දේශපාලන ගමන් පථය විධිමත් කිරීමක් පමණි.

### 2. කහ කබා විරෝධතා: පුළුල් සමාජ පදනමක්, තියුණු මායිමක්, එකම දේශපාලන සීමාවක්

කහ කබා ව්‍යාපාරය වෝල් වීදිය වෝඩිලෑමේ ව්‍යාපාරයට වඩා තියුණු සමාජ රැඩිකල්වාදයක් සහ සැලකිය යුතු ලෙස පුළුල් කම්කරු පන්තික සමාජ පදනමක් ප්‍රකාශ කළේය. එහි භූගෝලීය හා සමාජීය ගුරුත්ව කේන්ද්‍රය පළාත් බද (පැරිස් අගනුවරින් පිටත) ප්‍රංශයේ–මගීන්, විශ්‍රාමිකයන්, කුඩා ව්‍යාපාර හිමිකරුවන්, අස්ථිර කම්කරුවන් සහ ප්‍රවාහන වියදම් වැඩි වීමෙන්, ප්‍රාදේශීය රාජ්‍ය සේවාවන්හි පහත වැටීමෙන් සහ නව ලිබරල් ප්‍රතිව්‍යුහගතකරණය යටතේ වැටුප් බාදනය වේගවත් වීමෙන් පීඩාවට පත් ග්‍රාමීය හා අර්ධ නාගරික දුප්පතුන් අතර–පිහිටා තිබුණි. මැක්‍රොන්ගේ සුපිරි පුරවර සැලසුම් පිළිබඳ උද්‍යෝගී සහායකයන් විසින් සමරනු ලබන "නවීකරණයේ" පිරිවැයට වඩාත් සෘජුවම නිරාවරණය වන කම්කරු පන්තියේ සහ පහළ මධ්‍යම පන්තියේ ස්ථර තුළ මුල් බැසගත් මෙම විසරණය වූ, පළාත් සමාජ සංයුතිය, වෝඩිලෑමෙහි හි පුරවරයන්හි සාන්ද්‍රණය වී තිබූ ප්‍රමාණයට වඩා, කහ කබා විරෝධතා වලට පුළුල් භූගෝලීය ප්‍රවේශයක් සහ ධනේශ්වර පාලනය සමඟ වඩාත් සෘජු ද්‍රව්‍යමය ගැටුමක් ලබා දුන්නේය.

එහි උපක්‍රම ඊට අනුරූපව වඩාත් අවහිරකාරී විය. සතිපතා රටපුරා ක්‍රියාකාරකම්, වටරවුම් සහ ගාස්තු අය කරන මාර්ග අවහිර කිරීම්, ප්‍රධාන වාණිජ මාර්ග අත්පත් කර ගැනීම සහ පැරිසියේ සහ පළාත් නගරවල කැරලි මර්දන පොලිසිය සමඟ ගැටුම්, ධනවාදී සංසරණය සඳහා සැබෑ පිරිවැයක් නිර්මාණය කළ අතර ප්‍රංශ පාලක පන්තිය, වෝඩිලෑම සංකේතාත්මක චතුරශ්‍ර වාඩිලාගැනීම් මගින් අත්කර නොගත් ආකාරයේ, තිරසාර දේශපාලන පීඩනයකට ලක් කළේය. ඇතැම් අවස්ථාවන්හිදී, කහ කබා ව්‍යාපාරය ගුරුවරුන්, සෞඛ්‍ය සේවකයින්, ප්‍රවාහන සේවකයින්ගේ වැනි වැඩ වර්ජන රැළි සමඟ ඡේදනය වූ අතර, මහජන වීදි විරෝධතා සහ සංවිධානාත්මක කාර්මික ක්‍රියාමාර්ග අතර ඒකාබද්ධ වීමේ සැබෑ හැකියාව– කිසි විටෙකත් සංවිධානාත්මක යථාර්ථයක් නොවූ වද–නිර්මාණය කළේය.

මෙම හැකියාව ක්‍රමානුකූලව අවහිර කරන ලදී. කහ කබාකරුවන් සහ සංවිධානාත්මක කම්කරු ව්‍යාපාරය අතර කිසිදු ඒකාග්‍ර වීමක් වැළැක්වීම සඳහා ප්‍රංශ වෘත්තීය සමිති සම්මේලන



2018 දෙසැම්බර් 8 වන දින ප්‍රංශයේ පැරිසියේ පැවති “කහ කබා” ව්‍යාපාරයේ ජාතික විරෝධතා දිනයක් අතරතුර කහ කබා පැළඳ සිටින විරෝධතාකරුවන් එක්රැස් වන ප්ලේස් ඩි ලා රිපබ්ලික් හි දසුනක්. REUTERS/Stephane Mahe/ ගොනු ඡායාරූපය

ක්‍රමානුකූලව කටයුතු කළේය.[10] ව්‍යාපාරය තුළ සහ අවට වාම-ජනප්‍රියවාදී ප්‍රවණතා “ප්‍රභූන්ට එරෙහිව ජනතාව” යන වාග් මාලාවෙන් ඉල්ලීම් සකස් කළහ—එනම්, ජනමත විචාරණ, ධනය නැවත බෙදා හැරීම සහ ශක්තිමත් ජාතික සුභසාධන ප්‍රතිපාදන සඳහා වන ඉල්ලීම්. ඒවා හුදෙක් ක්‍රමයේ වඩාත් දෘශ්‍යමාන දූෂිත හෝ අහංකාර තනි නියෝජිතයන් නොව, පද්ධතිමය සතුරා, එනම්, ධනපති පන්තිය සහ එහි රාජ්‍යය හඳුනා ගැනීම වැලක්වනු ලැබීය.[11] මැක්‍රොන්ගේ රජය දිවි ගලවා ගත්තේය. කහ කබාකරුවන් විසිරී ගියහ. යටින් පවතින සමාජ අර්බුදය තීව්‍ර විය.

### 3. ජෙන්-Z රැල්ල: ගෝලීය පරිමාණය, විප්ලවීය තීව්‍රතාවය, එකම දේශපාලනික ඌනතාවය

ජෙන්-Z නැගිටීම් භූගෝලීය පරාසය සහ විප්ලවීය තීව්‍රතාවය යන දෙකෙහිම ගුණාත්මක උත්සන්න වීමක් නියෝජනය කරයි. පැරණි යටත් විජිත ලෝකයේ රටවල් කිහිපයක එකවර සිදු වූ ඒවායේ සටන්කාමී ශිෂ්‍ය හා තරුණ පෙරමුණු, වැඩ වර්ජන සහ කාර්මික ක්‍රියාමාර්ග හරහා සැබෑ නිර්ධන පංති මැදිහත්වීමක් සමඟ ඒකාබද්ධ විය. 2022 අප්‍රේල් 28 සහ මැයි 6 යන දිනවල ශ්‍රී ලංකාවේ පැවති මහා වැඩ වර්ජන දෙක, ජනවාර්ගික රේඛා හරහා මිලියන ගණනක් සහභාගී වූ අතර, ස්වාධීන බලවේගයක් ලෙස ක්‍රියා කරන විට කම්කරු පන්තියේ තීරණාත්මක බලය පෙන්නුම් කළේය.[12] ජෙන්-Z හි ආරම්භක විරෝධතාවලින් පසුව කෙන්යාවේ ගුරුවරුන්, සෞඛ්‍ය සේවකයින්, සිවිල් සේවකයින් සහ ප්‍රවාහන සේවකයින්ගේ අඛණ්ඩ වැඩ වර්ජන රැළි පුපුරා ගියේය.[13] දේශපාලන අවහිර කිරීමේ පරිමාණය—රාජ්‍ය නායකයින් ධුරයෙන් පලවා හැරීම, පාර්ලිමේන්තු තුලට කඩා වැදීම, ආණ්ඩු බිඳ වැටීම—වාඩිලෑම හෝ කහ කබා උද්ඝෝෂණ විසින් ඇති කරන ලද සියලු දේ අභිබවා ගියේය.




නේපාලයේ ජෙනරාල්-ඉසෙඩ් විරෝධතා. රූපය Kathmandupost.com අනුග්‍රහයෙනි

එහෙත් මෙම ව්‍යාපාර ක්‍රියාත්මක වූ දේශපාලන රාමුව, ධනේශ්වර සංවර්ධනය ප්‍රමාද වූ මෙම රටවල ප්‍රතිනිෂ්පාදනය කළේ අධිරාජ්‍යවාදී මධ්‍යස්ථානවල වාඩිලෑම සහ කහ කබාකරුවන් සිරකර පාවා දුන් එක සමාන ගතිකයන්මය. “රජය ක්‍රියාකාරීව නායකයින් සොයමින් සිටී” යන පදනම මත නායකත්වයක් නොමැතිකම සාධාරණීකරණය කරමින් කෙන්යාවේ විප්ලවවාදී සමාජවාදී සංගමය (Revolutionary Socialist League), රයිලා ඔඩින්ගා සහ වෘත්තීය සමිති නිලධරය විසින් පුරවන ලද දේශපාලන රික්තයක් නිර්මාණය කළේය.[14] මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය-කෙන්යාව (Communist Party Marxist-Kenya), බ්‍රිතාන්‍ය සහ එක්සත් ජනපද අරමුදල් වලින් පාලක පන්තිය විසින් කෙටුම්පත් කරන ලද 2010 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය කළ අතර, එමඟින් මහජන කෝපය ධනේශ්වර-ප්‍රජාතන්ත්‍රවාදී මිත්‍යාවන් වෙතට හරවා යැවීය. පිලිපීනයේ බයාන් (BAYAN) සහ අක්බයාන් (Akbayan) ධනේශ්වර චීන-විරෝධී කන්ඩායම් සමඟ පෙලගැසී, කම්කරු පන්ති දේශපාලනය එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ඉන්දු-පැසිෆික් ගැටුමේ උපායමාර්ගික අත්‍යවශ්‍යතාවයන්ට යටත් කළේය.[15]

ව්‍යාජ වමේ ජාත්‍යන්තර ස්වභාවය අහඹු සිදුවීමක් නොවේ: මෙම සංවිධාන සහභාගී වන්නේ, එක්සත් ජනපදය තුළ ISO විසින් මූර්තිමත් කරන ලද, ධනවාදය ආරක්ෂා කිරීම සහ කම්කරු

පන්ති අතෘප්තිය කළමනාකරණය කිරීම ඔවුන්ගේ ද්‍රව්‍යමය අවශ්‍යතාවක් වන ධනවත් මධ්‍යම පන්තික ස්ථර නියෝජනය කරන එකම ජාත්‍යන්තර දේශපාලන ධාරාවට ය. විප්ලවවාදී පක්ෂ ගොඩනැගීමෙන් වැලකී ගැනීම සඳහා ඔවුන් ස්වයංසිද්ධියට ප්‍රශංසා කරති. ඔවුන් පන්ති බෙදීම් සැඟවීමට “ජනතා බලය” සහ “දූෂණ විරෝධය” ප්‍රවර්ධනය කරති. ඔවුහු “ප්‍රගතිශීලී” විකල්ප ලෙස ඉදිරිපත් කරනු ලබන විරුද්ධ ධනේශ්වර බලවේග සමඟ පෙළ ගැසෙති. WSWS නිරන්තරයෙන් අනතුරු අඟවා ඇති පරිදි, මෙම ප්‍රවණතා වෛෂයිකව “වම” තුළ ධනේශ්වර දෘෂ්ටිවාදය සඳහා සංචිතයක් ලෙස සේවය කරයි. [16]

**මතු සම්බන්ධයි....**

**සබැඳි ලිපි:**


[1] World Socialist Web Site, ‘Revolution and counterrevolution in Egypt: The political lessons’ (7 September 2013) <https://www.wsws.org/en/articles/2013/09/07/egyr-s07.html>

[2] World Socialist Web Site (Nick Beams), ‘Notes on the Egyptian Revolution’ (25 February 2011) <https://www.wsws.org/en/articles/2011/02/nbre-f25.html>

World Socialist Web Site, ‘Third National Congress of the SEP (Sri Lanka): Greetings from the French and German sections of the world Trotskyist movement’ (19 June 2022) <https://www.wsws.org/en/articles/2022/06/20/bnmf-j20.html>

[3] World Socialist Web Site (Bill Van Auken), ‘Ex-SDS leader seeks to herd Wall Street protest behind Obama’ (12 October 2011) <https://www.wsws.org/en/articles/2011/10/gitl-o12.html>

[4] World Socialist Web Site, ‘The way forward in the fight against Wall Street’ (15 October 2011) <https://www.wsws.org/en/articles/2011/10/pers-o15.html>

[5] World Socialist Web Site, ‘Occupy Wall Street movement at a crossroads’ (26 October 2011) <https://www.wsws.org/en/articles/2011/10/pers-o26.html>

[6] The WSWS analysis identified this with precision: “The social and political outlook of those at the core of the protests—including anarchist organizations around the Canadian magazine Adbusters, which initiated the call to occupy Wall Street—was fundamentally hostile to the working class. Contained in the ‘99 percent’ slogan itself was an effort to obscure the deep social divide between the working class and the more privileged sections of the upper-middle class, for which these groups spoke.”

World Socialist Web Site, ‘The 2011 Occupy Wall Street Protests’ (editorial overview) <https://www.wsws.org/en/topics/socialIssuesCategory/wallst> , drawing on ‘The way forward in the fight against Wall Street’ (15 October 2011) <https://www.wsws.org/en/articles/2011/10/pers-o15.html>

[7] World Socialist Web Site, ‘The Nation, ISO seek to channel Wall Street protests back to the Democratic Party’ (7 October 2011) <https://www.wsws.org/en/articles/2011/10/nati-o07.html>

World Socialist Web Site, ‘The Occupy movement, identity politics and the International Socialist Organization’ (11 November 2011) <https://www.wsws.org/en/articles/2011/11/iden-n11.html>

[8] World Socialist Web Site, ‘How to fight Wall Street’ (4 October 2011) <https://www.wsws.org/en/articles/2011/10/pers-o04.html>

[9] World Socialist Web Site, ‘The shutdown of Occupy Wall Street’ (17 November 2011) <https://www.wsws.org/en/articles/2011/11/pers-n17.html> ; see also ‘Mayors conspired to close Occupy Wall Street encampments’ (17 November 2011) <https://www.wsws.org/en/articles/2011/11/occu-n17.html> and ‘Police repression escalates against Occupy protests’ (19 November 2011) <https://www.wsws.org/en/articles/2011/11/occu-n19.html>

[10] World Socialist Web Site, ‘Oppose French unions’ attempts to strangle the “yellow vest” protests!’ (26 January 2019) <https://www.wsws.org/en/articles/2019/01/26/yell-j26.html>

[11] World Socialist Web Site, ‘France’s “yellow vest” protests and the resurgence of the international class struggle’ (3 July 2019) <https://www.wsws.org/en/articles/2019/07/03/yell-j03.html>

World Socialist Web Site, ‘Recording reveals pseudo-left La France Insoumise collusion with Macron in 2016’ (14 December 2019) <https://www.wsws.org/en/articles/2019/12/14/ruff-d14.html>

[12] Socialist Equality Party (Sri Lanka), ‘For a Democratic and Socialist Congress of Workers and Rural Masses!’ (20 July 2022) <https://www.wsws.org/en/articles/2022/07/21/pers-j21.html >

[13] World Socialist Web Site, ‘Kenya’s Gen Z insurgency, the strike wave and the struggle for Permanent Revolution-Part 1’ (3 October 2024)

<https://www.wsws.org/en/articles/2024/10/03/rhnr-o03.html>

[14] World Socialist Web Site, ‘Kenya’s Gen Z insurgency, the

strike wave and the struggle for Permanent Revolution — Part 3' (6 October 2024) <https://www.wsws.org/en/articles/2024/10/06/xrfc-o06.html> ; see also 'One year since the Gen-Z Uprising in Kenya: The need for a socialist and internationalist strategy' (24 June 2025) <https://www.wsws.org/en/articles/2025/06/24/yvsc-j24.html>

[15] World Socialist Web Site, 'Washington's war drive against China fuels political conflict in the Philippines' (8 November 2023) <https://www.wsws.org/en/articles/2023/11/08/xjyz-n08.html> ; see also 'Philippine Maoists support US war drive against China' (5 June 2015) <https://www.wsws.org/en/articles/2015/06/05/phil-j05.html>

[16] World Socialist Web Site, 'The resurgence of the class struggle and the tasks of the Socialist Equality Party (UK)' (5 December 2018) <https://www.wsws.org/en/articles/2018/12/05/con3-d05.html>

**ගාසාවේ සියොන්වාදී ජන සංහාරය නවතනු!**

**අධිරාජ්‍යවාදී ණය අහෝසි කරනු!**

# ට්‍රම්ප්ගේ ඇමරිකාවේ සැබෑ තත්වය: සමාජ කාලකන්නිභාවය, ආඥාදායකත්වය, යුද්ධය—සහ පන්ති අරගලයේ නැගීමක්

**WSWS කර්තෘ මණ්ඩලය**

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* පෙබරවාරි *23* වන දින ***'The real state of Trump's America: Social misery, dictatorship, war—and an upsurge of class struggle'*** යන හිසින් පළවූ **WSWS කර්තෘ මණ්ඩලය විසින්** ප්‍රකාශයට පත් කරන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

මෙම දේශනය පවත්වනු ලබන්නේ එක්සත් ජනපද නිදහස් ප්‍රකාශනයේ 250 වන සංවත්සරය සැමරීමට නියමිත වර්ෂයේදීය. 2026 ජූලි 4 වන දින, "සියලු මිනිසුන් සමාන ලෙස නිර්මාණය කර ඇත" යනුවෙන් ප්‍රකාශ කරන ලද සහ "ජීවිතය, නිදහස සහ සතුට ලුහුබැඳීමේ" අහිමි කළ නොහැකි අයිතිවාසිකම් තහවුරු කරන ලද ලේඛනය නිකුත් කිරීම ජාතිය විසින් සමරනු ඇත. රාජ්‍යය බිහිකිරීමේ පුරෝගාමීහු III වන ජෝර්ජ් රජුට එරෙහිව විප්ලවයක් සිදු කළහ.



ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්, 2026 පෙබරවාරි 23 වන සඳුදා වොෂින්ටනයේ ධවල මන්දිරයේ නැගෙනහිර කාමරයේ "දේවදූත පවුල් දිනය (Angel Family Day)" ප්‍රකාශයට පත් කිරීමේ උත්සවයක් අතරතුර. [AP ඡායාරූපය/ඉවාන් වුචි]

ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් කොංග්‍රසයේ ඒකාබද්ධ සැසිවාරයේදී අඟහරුවාදා රාත්‍රියේ වාර්ෂික රාජ්‍ය තත්ව දේශනය පවත්වනු ඇත. අවංකව එම කතාව නම් කරනු ලැබුනේ නම්, එය "ධනවතුන්ගේ රාජ්‍යය" ලෙස හඳුන්වනු ඇත—එය ඇමරිකානු ජීවිතයේ විනාශකාරී යථාර්ථය බොරු කන්දක් යට වළලමින් ස්වයං-සුබ පැතුම් ප්‍රකාශ කිරීමේ වාචාල කතාවල අභ්‍යාසයකි.

වසර දෙසිය පනහකට පසු, ට්‍රම්ප්ගේ ඇමරිකාව ප්‍රකාශනයේ පරමාදර්ශයන්ට තමන්ගේම පිළිතුරක් ලබා දෙයි: එය, බිලියනපතියන් විසින් සහ බිලියනපතියන් සඳහා වූ බිලියනපතියන්ගේ රජයක්, සංක්‍රමණික ප්‍රජාවන්ට එරෙහිව සන්නද්ධ වැටලීම් මෙහෙයවීම, රට පුරා පැතිරී ඇති ගාල් කිරීමේ කඳවුරු ජාලයක්, දෙමාපියන්ගෙන් උදුරා ගන්නා ලද දරුවන් සහ මිනියාපොලිස් වීදිවල ෆෙඩරල් නියෝජිතයන් විසින් නිරායුධ

සිවිල් වැසියන්ට වෙඩි තැබීම, ආදී දේ වලින් යුක්තව ඇත.

රැස්වීමේ කටයුතු පුරා පැතිර ඇත්තේ ජෙෆ්රි එප්ස්ටයින්ගේ දුර්ගන්ධයයි. ළමා ලිංගික ශ්‍රම ජාවාරම්කරුවෙකු සමඟ බිලියනපතියන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ දේශපාලන පුද්ගලයින්ට පැවති සම්බන්ධතා හෙළිදරව් කරමින් අධිකරණ දෙපාර්තමේන්තුව විසින් පිටු මිලියන 3 කට ආසන්න ප්‍රමාණයක් නිකුත් කිරීම මගින් සංස්ථාපිත ඇමරිකාවේ ඉහළ ස්ථර සොලවා ඇත. ලෝසවෙඅ සභාපති ඩේවිඩ් නෝර්ත් මෑතකදී සදහන් කල පරිදි, එම ලිපිගොනු , “දිරාපත්වීමේ ඉහළම තත්වයක සිටින පරිහානියට පත් පාලක පන්තියක සහ කතිපයාධිකාරී සමාජයක සමාජ දේහය හෙළි කරයි. ඔවුන්ගේ අපරාධ ඉහළම ගනණයේ ඒවාය; ඒවායින් මහත් කුණුගඳ වහනය වේ.”

මේවාට ට්‍රම්ප්ම ගැඹුරින් සම්බන්ධ වී සිටී. නීතිපති පැම් බොන්ඩි, ඩව් දර්ශකය 50,000 දක්වා ඉහළ ගොස් ඇති බවට පුරසාරම් දොඩමින්, අඛණ්ඩ කෙරෙන කරණු වසන් කිරීම පිළිබඳ ප්‍රශ්නවලට ප්‍රතිචාර දැක්වීය. 2019 දී බිලියනපති ලෙස්ලි වෙක්ස්නර් එප්ස්ටයින්ගේ සම-කුමන්ත්‍රණකරුවෙකු ලෙස හඳුනාගෙන ඇති බව FBI ලේඛනවලින් හෙළි වන නමුත්, කිසිදු චෝදනාවක් ඔහුට එරෙහිව ඉදිරිපත් කර නොමැත. එප්ස්ටයින් තමා ජාවාරම් කළ ගැහැණු ළමයින් “හිස ඉවත් කර ශරීරය තබා ගන්නා ඉස්සන්” සමඟ සංසන්දනය කර ඇති බව විද්‍යුත් තැපැල් ලිපි පෙන්වයි. මේ ඇමරිකාව පාලනය කරන පාලක පන්තියයි.

ට්‍රම්ප්ගේ ප්‍රලාප යටින් වැළලෙන කරුණු සලකා බලන්න. ජාතික ණය ඩොලර් ට්‍රිලියන 38.4 ක් වන විට රටේ සෑම පුද්ගලයෙකුම ඩොලර් 113,000 ක ණය බරක් දරයි. එය දිනකට ඩොලර් බිලියන 8 කින් වැඩි වෙමින් පවතී. කොංග්‍රස් අයවැය කාර්යාලය (CBO) මෙම වසරේ අය වැය හිඟය ඩොලර් ට්‍රිලියන 1.9 ක් ලෙස ප්‍රක්ෂේපණය කරන අතර එය 2036 වන විට ඩොලර් ට්‍රිලියන 3.1 දක්වා වර්ධනය වේ. ණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 120 දක්වා ළඟා වන අතර එය ජාතියේ ඉතිහාසයේ ඕනෑම අවස්ථාවකට වඩා ඉහළ අගයක් ගනී.

2025 දී ඩොලරය සියයට 9 කට වඩා පහත වැටුණි. එය 2017 න් පසු එහි නරකම වාර්ෂික ක්‍රියාකාරීත්වය වන අතර පසුබෑමක කලාපයේ පවතී. BRICS රටවල් දේශීය මුදල් ඒකක වලින් වෙළඳ පියවීම් සියයට 35 සිට 50 දක්වා වැඩි කර ඇත. 2020 සිට සමුච්චිත මිල ඉහළ යාම විනාශකාරී වී ඇත: ආහාර මිළ සියයට 25 ට වඩා ඉහළ යාම, නිවාස පිරිවැය තවමත් වාර්ෂිකව සියයට 3 කින් ඉහළ යාම සහ ස්වාභාවික ගෑස් සියයට 10 කින් පමණ ඉහළ යාම ආදී වශයෙනි.

සමාජ අසමානතාවයේ මට්ටම ඓතිහාසික වශයෙන් පෙර නොවූ විරූ මට්ටමක පවතී. ඉහළම කුටුම්භ 1% දැන් සියලු ධනයෙන් සියයට 31.7 ක් පාලනය කරයි. එය 1989 දී ෆෙඩරල් මහ බැංකුව එවැනි දත්ත නිරීක්ෂණය කිරීමට පටන් ගත් දා සිට ඉහළම කොටසයි. ඔවුන් සතුව ඩොලර් ට්‍රිලියන 55 ක් ඇති අතර එය ජන ගහනයෙන් පහළම සියයට 90 ට ඇති ධනයේ එකතුවට සමානය. ඇමරිකානු බිලියනපතියන් 935 දෙනෙකුගේ ඒකාබද්ධ ධනය 2025 අවසානයේ ඩොලර් ට්‍රිලියන 8.1 දක්වා ඉහළ ගියේය.

DOGE ( රජයේ කාර්යක්ෂමතා දෙපාර්තමේන්තුව) හරහා ෆෙඩරල් රජය විසුරුවා හැරීමේ ට්‍රම්ප්ගේ හවුල්කරු වන එලොන් මස්ක්, ඔහුගේ ධනය ඩොලර් බිලියන 726 දක්වා ඉහළ දමාගෙන තිබේ. S&P 500 සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්ගේ වන්දි ගෙවීම් වල සාමාන්‍යයය ඩොලර් මිලියන 18.9 ක් විය—එය සාමාන්‍ය සේවකයෙකුගේ වැටුප මෙන් 285 ගුණයකි; එය 1965 දී පැවති 21 ට 1 වන අනුපාතයේ සිට ඉහළ ගොස් ඇත. 1978 සිට ප්‍රධාන විධායක නිලධාරී වැටුප සියයට 1,094 කින් ඉහළ ගොස් ඇති අතර සේවක වැටුප සියයට 26 කින් පමණක් වැඩි වී තිබේ. ටෙස්ලා සමාගම මස්ක් සඳහා ඩොලර් ට්‍රිලියන 1 ක වැටුප් පැකේජයක් යෝජනා කර ඇති අතර එය සමස්ත ෆෙඩරල් ශ්‍රම බලකායේ මුළු වාර්ෂික වන්දි මුදල ඉක්මවා යයි. කොටස් වෙළඳපොළ ජාතික සමෘද්ධිය පිළිබඳ මිනුමක් නොවේ. එය පාලක පන්තියේ පොහොසත්කම පිළිබඳ පරාමිතියකි.

නමුත් එක්සත් ජනපදයේ සැබෑ තත්වයේ වඩාත්ම භයානක මානය වන්නේ ජනගහනයට එරෙහිව සන්නද්ධ ෆෙඩරල් නියෝජිතයන් යෙදවීමයි. 2025 දෙසැම්බර් මාසයේදී පරිපාලනය විසින් ඔපරේෂන් මෙට්‍රෝ සර්ජ් (Operation Metro Surge) දියත් කරන ලද අතර, වෙස්මුහුණු පැළඳගත් ICE (එක්සත් ජනපද ආගමන සහ රේගු බලාත්මක කිරීමේ ආයතනය) සහ දේශසීමා මුර සංචාර නියෝජිතයන් 3,000 ක් මිනසෝටා හි නිවුන් නගරවලට යොදවන ලදී. DHS (එක්සත් ජනපද ස්වදේශ ආරක්ෂක දෙපාර්තමේන්තුව) විසින්ම එය ඇමරිකානු ඉතිහාසයේ විශාලතම සංක්‍රමණ විරෝධී මෙහෙයුම ලෙස හැඳින්විණි. ජනවාරි 7 වන දින, ICE විසින් 37 හැවිරිදි ඇමරිකානු පුරවැසියෙකු සහ දරුවන් තිදෙනෙකුගේ මවක් වන රෙනී ගුඩ් වෙඩි තබා ඝාතනය කරන ලදී. ජනවාරි 24 වන දින, දේශසීමා මුර සංචාර නියෝජිතයන් 37 හැවිරිදි ICU හෙද නිලධාරියෙකුවන ඇලෙක්ස් ප්‍රෙට්ටිට වෙඩි තබා ඝාතනය කළ අතර, ඔහු බිම වැතිර සිටියදී ඔහුට වට 10 ක් පමණ වෙඩි තැබීය.

පරිපාලනය රට පුරා රැඳවුම් කඳවුරු ජාලයක් ගොඩනගා ඇති අතර, එහි පුද්ගලයින් 66,000 කට ආසන්න සංඛ්‍යාවක් රඳවා ඇත—එය සියයට 75 ක වැඩිවීමක් වන අතර එය ඉතිහාසයේ ඉහළම මට්ටමයි. කොංග්‍රසය තවත් එවැනි මධ්‍යස්ථාන සඳහා ඩොලර් බිලියන 45 ක් වෙන් කර ඇති අතර, එහි ධාරිතාව 135,000 ක් ලෙස ප්‍රක්ෂේපණය කර ඇත. වාර්තාගත අනුපාතයකින් දරුවන් තම දෙමාපියන්ගෙන් වෙන් කරනු ලැබේ. ටෙක්සාස් හි ෆෝර්ට් බ්ලිස් (Fort Bliss) හි කූඩාරම් කඳවුරක, දෙවන ලෝක යුද්ධ සමයේදී ජපන්

ඇමරිකානුවන් සඳහා සිර කඳවුරක් ලෙස පාවිච්චියට ගත් භූමියේම පුද්ගලයින් 5,000 ක් රඳවා සිටී. 2025, ICE රඳවා තබා ගැනීම සඳහා වාර්තාගත මාරාන්තිකම වසර විය.

මෙහිදී ඩිමොක්‍රටික් පක්ෂය කිසිදු සැබෑ විරුද්ධත්වයක් ඉදිරිපත් නොකරනු ඇත. අඟහරුවාදා රාත්‍රියේ ඔවුන් කරන ඕනෑම අභිනයක් අර්ථ විරහිත ප්‍රයෝග වනු ඇත. සැබෑ භාවිතයේදී, පාලක පන්තියට වඩාත්ම වැදගත් කරුණු සම්බන්ධයෙන් ඔවුහු ට්‍රම්ප් සමඟ සහයෝගයෙන් කටයුතු කරති. ට්‍රම්ප් සමඟ ඔවුන්ගේ මතභේද පවතින තැන්වල, ඔවුන් කේන්ද්‍රගත වී ඇත්තේ අධිරාජ්‍යවාදී උපායමාර්ගයේ උපායශීලී ප්‍රශ්න මත ය—සියල්ලටත් වඩා, යුක්රේනය තුළ රුසියාවට එරෙහි එක්සත් ජනපද-නේටෝ ප්‍රොක්සි යුද්ධයට ඔහු ප්‍රමාණවත් සහයෝගයක් නොදැක්වීම පිළිබඳ අතෘප්තියි. නමුත් ඉරානය සමඟ යුද්ධය කරා යන ගමනේදී, පක්ෂ දෙක අත්‍යවශ්‍ය එකඟතාවයක සිටිති.

ට්‍රම්ප්ගේ රාජ්‍ය තත්ව දේශනයට ප්‍රතිචාරය ඉදිරිපත් කිරීම සඳහා ඩිමොක්‍රටික් පක්ෂය සීඅයිඒ හිටපු ප්‍රවීණයන්—පසුගිය වසරේ සෙනෙට් සභික එලිසා ස්ලොට්කින් සහ මෙම වසරේ වර්ජිනියා ආණ්ඩුකාර අබිගේල් ස්පාන්බර්ගර් – තෝරා ගැනීමම, බර්නි සැන්ඩර්ස් සහ ඇලෙක්සැන්ඩ්‍රියා ඔකාසියෝ-කෝර්ටෙස්ගේ “වාම” හඬක් සහිත වාචාලකම භාවිතා කරමින් පහළින් මහජන ව්‍යාපාරයක් මතුවීම අවහිර කිරීම සඳහා ඔවුන් මිලිටරි-බුද්ධි යාන්ත්‍රණය ආරක්ෂා කරන බවට පාලක පන්තියට දෙනු ලැබූ සහතිකයකි.

නිදහස් ප්‍රකාශනයේ සිට 250 වන වසර වන විට ට්‍රම්ප්ගේ ඇමරිකාවේ සැබෑ තත්වය මෙයයි: එය, ස්වර්ණමය යුගයේ (Gilded Age) සිට නොදුටු පරිමාණයකින් පන්ති ප්‍රතිවිරෝධතාවලින් ඉරිතලා ගිය, ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ මවාපෑම පවා අත්හැර දැමූ, විදේශයන්හි යුද්ධයට සහ රට තුළ ආඥාදායකත්වයට නැඹුරු වූ අපරාධකාරී කතිපයාධිකාරීත්වයක් විසින් පාලනය කරන ලද සමාජයකි.

නමුත් සමීකරණයට තවත් පැත්තක් ඇති අතර එය තීරණාත්මක එකකි. පාලක පන්තිය ෆැසිස්ට්වාදය හා යුද්ධය කරා තල්ලු කරන එම අර්බුදයම කම්කරු පන්තිය අරගලයට තල්ලු කරයි. වර්ධනය වන වැඩ වර්ජන රැල්ලක්, ICE විරෝධී මහජන විරෝධතා, පසුගිය වසරේ “නෝ-කිංග්ස් ( රජුන් එපා!)” පාගමන්, උසස් පාසල් සිසුන්ගේ අඛණ්ඩ පාගමන්—මේවා මහා ව්‍යාපාරික පක්ෂ දෙකට පාලනය කළ නොහැකි සමාජ බලවේගයක ආරම්භක ප්‍රකාශනයන් වේ.

තීරනාත්මක ප්‍රශ්නය වන්නේ දේශපාලන වැඩපිළිවෙල, ඉදිරිදර්ශනය සහ සංවිධානය පිළිබඳ එකකි. ට්‍රම්ප් පරිපාලනයට එරෙහි විරෝධය ඔහු කරන සෑම දෙයකටම හවුල් වන ඩිමොක්‍රටිකයන්ට භාර දිය නොහැක. එය කම්කරු පන්තියේ ස්වාධීන බලමුලු ගැන්වීම මත පදනම් විය යුතුය.

කම්කරුවන් සෑම වැඩබිමකම, පාසලකම සහ අසල්වැසි ප්‍රදේශයකම ක්‍රියාකාරී කමිටු පිහිටුවා ගත යුත්තේ ප්‍රතිරෝධය සම්බන්ධීකරණය කිරීමට, ICE ත්‍රස්තවාදය අවසන් කරන ලෙස ඉල්ලා සිටීමට, සංක්‍රමණිකයන් ආරක්ෂා කිරීමට සහ රජයේ යුද, කප්පාදු සහ ආඥාදායකත්ව වැඩසටහනට එරෙහිව මහා වැඩ වර්ජනයකට සූදානම් වීමට ය. සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී වැඩසටහනක පදනම මත සංවිධානය කරන ලද එවැනි කමිටු ගොඩනැගීම ඇමරිකානු කතිපයාධිකාරීත්වයේ ෆැසිස්ට් කුමන්ත්‍රණය පරාජය කිරීම සඳහා ඇති එකම යථාර්ථවාදී උපාය මාර්ගයයි.

**"ඉරානයට අත නොතබනු"ලෙස සහ මැද පෙරදිගින් සියලුම ඇමරිකානු සහ අනෙකුත් අධිරාජ්‍යවාදී බලවේග ඉවත් කර ගැනීම, ගාසා තීරයේ ඊශ්‍රායල ජන සංහාරය අවසන් කිරීම සහ ඉරානයට එරෙහි සියලු සම්බාධක ඉවත් කිරීම සඳහා බලකරමින් විරෝධතා සහ වැඩවර්ජන සංවිධානය කළ යුතුය. එවැනි ක්‍රියාවන්, අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහි විරෝධය, සමාජ හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් වනසා දැමීමට එරෙහිව ජාත්‍යන්තර කම්කරු පන්තියේ වැඩෙන අරගල සමඟ සම්බන්ධ කිරීමේ සටන මගින් සජීවීකරණය කළ යුතු අතර, යුද්ධයේ, ආඥාදායකත්වයේ සහ කතිපයාධිකාරයේ මූලාශ්‍රය වන ධනවාදය අවසන් කිරීම සඳහා විප්ලවවාදී සමාජවාදී ක්‍රියාමාර්ගයක් සහ ඉදිරිදර්ශනයකින් සපුරා ගත යුතුය."**

**කීත් ජෝන්ස්, ලෝක සමාජවාදී වෙබ් අඩවිය.**
**(2026 පෙබරවාරි 27)**

 ISSN 3093-6217

# චීනයේ BYD හි ෂියාන් කම්හලේ කම්කරුවෝ දරිද්‍රතා වැටුප් වලට එරෙහිව වැඩ වර්ජනය කරති

**පීටර් සිමන්ඩ්ස්** විසිනි.

මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(ලෝසවෙඅ) 2026* පෙබරවාරි *08* වන දින ***'Workers at BYD's Xi'an plant in China strike over poverty wages'*** යන හිසින් පලවූ **පීටර් සිමන්ඩ්ස්** විසින් ලියන ලද ලිපියේ සිංහල පරිවර්තනය යි.




2025 මාර්තු 6 වන බ්‍රහස්පතින්දා, බ්‍රසීලයේ බහියා ප්‍රාන්තයේ කැමකාරි හි ඉදිවෙමින් පවතින කර්මාන්ත ශාලාවක් අසල BYD සංකේතය ප්‍රදර්ශනය කෙරේ.[AP ඡායාරූපය/එරල්ඩෝ පෙරෙස්]

පෙබරවාරි 5 වන දින, ෂියාන්හි (Xi'an's) අධි-තාක්ෂණික කලාපයේ ජික්සියන් කාර්මික උද්‍යානයේ (Jixian Industrial Park) පිහිටි BYD හි අධි වෝල්ටීයතා විදුලි උපකරණ කම්හලේ කම්කරුවන් තම කෑලි-අනුපාත ප්‍රසාද දීමනා මිලේච්ඡ ලෙස කප්පාදු කිරීම් වලට එරෙහිව සාමූහික වැඩ වර්ජනයක් දියත් කළහ. BYD හි දැනට ක්‍රියාත්මක පිරිවැය අඩු කිරීමේ මෙහෙයුම යටතේ, කම්කරුවන්ගේ සොච්චම් ආදායමේ තීරණාත්මක අංගයක් වන, උපරිම මාසික කෑලි-අනුපාත ප්‍රසාද දීමනාව යුවාන් 2,400 සිට යුවාන් 300-600 දක්වා අඩු කරන ලදී.

සමාජ රක්ෂණ සහ නිවාස අරමුදල් දායක මුදල් සඳහා අනිවාර්ය අඩු කිරීම් වලින් පසුව, බොහෝ සේවකයින් වාර්තා කළේ ඔවුන්ගේ මාසික අතට ලැබෙන වැටුප යුවාන් 2,000 ට (ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් 290) ට වඩා පහත වැටී ඇති බවයි. මෙම අගය වෙනත් විදිහකට පවසතොත්, මසකට යුවාන් 2,000 ක් වසරකට දළ වශයෙන් ඩොලර් 3,480 කි.

මේ අතර, BYD නිර්මාතෘ, සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී වැන්ග් චුවාන්ෆු (Wang Chuanfu) ගේ පසුගිය වසරේ ඇස්තමේන්තුගත පුද්ගලික ධනය ඩොලර් බිලියන 28.5 ක් බවෆෝබ්ස් වාර්තා කරයි. මසකට යුවාන් 2,000 ක් උපයන තනි BYD කර්මාන්තශාලා සේවකයෙකුට අද වැන්ග් සතුව ඇති ධනය රැස් කර ගැනීමට වසර මිලියන 8.2 කට වඩා කාලයක් වැඩ කිරීමට සිදුවනු ඇත.

මෙම දැවැන්ත විෂමතාවය අපගමනයක් නොව BYD හි ව්‍යාපාරික ආකෘතියේ අත්තිවාරමයි. එහිදී මූලික වැටුප් හිතාමතාම ප්‍රාදේශීය අවම වැටුප් මට්ටම්වලට වඩා යන්තම් ඉහළින් –සමහර විට යන්තම් සමාන වන සේ – සකසා ඇති අතර, සේවකයින්ට කළමනාකරණයේ අභිමතය පරිදි ඉවත් කර ගත හැකි අතිකාල, ප්‍රසාද දීමනා සහ කාර්ය සාධන අතිරේක දීමනා මත යැපීමට බල කෙරේ.

ෂියෑන් වැඩ වර්ජනය හුදකලා සිදුවීමක් නොවේ. එය වසර ගණනාවක් පුරා විහිදෙන සහ රටවල් ගණනාවක් සහ චීනයේ පළාත් පුරා පැතිරී ඇති BYD හි දැවැන්ත නිෂ්පාදන අධිරාජ්‍යය පුරා උත්සන්න වන කම්කරු නොසන්සුන්තාවයේ රටාවක නවතම පිපිරීමයි.

2024 මැයි මාසයේදී, එක්සත් ජනපදය පදනම් කරගත් ඉලෙක්ට්‍රොනික නිෂ්පාදකයෙකු වන ජබිල්ට (Jabil) අයත් වූ BYD හි වූක්සි (Wuxi) කම්හලේ සේවකයින් වැඩ වර්ජනය කළේ, සමාගම විසින් අතිකාල ඉවත් කරන නව කාලසටහනක් පැනවීමෙන් පසුවය. එය කම්කරුවන් ඔවුන්ගේ දරිද්‍රතා මට්ටමේ මූලික වැටුපට අතිරේකව යමක් උපයා ගත් ප්‍රධාන යාන්ත්‍රණයයි. වූක්සි හි BYD හි මූලික වැටුප, නීත්‍යානුකූල අවමයට වඩා යන්තම් ඉහළ යුවාන් 2,490 ක් ලෙස පිහිටුවා තිබුණි. චීන කම්කරු නීතියට අනුව සාමාන්‍ය අනුපාතයට වඩා 1.5 සිට 2 ගුණයකින් ගෙවීමට අවශ්‍ය වන අතිකාල ඉවත් කිරීම, සැබෑ මාසික ආදායම බොහෝ සේ පහත වැටීමට හේතු විය.

2025 මාර්තු අග සහ අප්‍රේල් මුලදී තත්වය නාටකාකාර ලෙස තීව්‍ර විය. මාර්තු 28-29 දිනවල වූක්සි කම්හලේ සේවකයින් 1,000 කට වැඩි පිරිසක් වැඩ වර්ජනය කළ අතර, මාර්තු 31 සිට අප්‍රේල් 1 දක්වා BYD හි චෙන්ග්ඩු කම්හලේ ඔවුන්ගේ සගයන් ද වැඩ වර්ජනය කළහ. දුක්ගැනවිලි සමාන විය: කාර්ය සාධනය මත පදනම් වූ වැටුප් අඩු කිරීම්, යුවාන් 30 ක උපන්දින සහනාධාරයක් වැනි සංකේතාත්මක ප්‍රතිලාභ පවා ඉවත්

කිරීම, අත්තනෝමතික තනතුරු මාරු කිරීම් සහ පහත් කිරීම්.

සියල්ලටත් වඩා, වුක්සි කම්හලේ කම්කරුවන්ගේ කෝපය යොමු වූයේ 2023 දෙසැම්බර් මාසයේදී ජබිල් හි ග්‍රීන් පොයින්ට් මෙහෙයුම් යුවාන් බිලියන 15.8 කට අත්පත් කර ගැනීමේදී BYD විසින් දුන් පොරොන්දු බරපතල ලෙස උල්ලංඝනය කිරීම කෙරෙහි ය. එහිදී කළමනාකාරිත්වය අවම වශයෙන් මාස 18 ක් වැටුප් හා කොන්දේසි නොවෙනස්ව පවතින බවට පොරොන්දු විය.

වුක්සි කම්හලට පොලිසිය යොදවා තිබූ අතර, විරෝධතාකරුවන් මහජන දර්ශනයෙන් වැළැක්වීම සඳහා රෙදි තිර ඉදිකර තිබුණි. වෙන්ග්ඩු හි, කැරලි මර්දන පොලිසිය සහ SWAT කණ්ඩායම් පසුගිය වසරේ අප්‍රේල් 2 වන දින වැඩ වර්ජනය බලහත්කාරයෙන් විසුරුවා හැරිය අතර, අත්අඩංගුවට ගැනීම් වාර්තා විය. මාර්තු මැද භාගයේදී එක් සේවකයෙකු ඒ වනවිටත් දින පහක් රඳවාගෙන සිටියේ සේවය පහත් කිරීමකට විරෝධය දැක්වීම නිසාය.

සූරාකෑමේ රටාව චීනයේ දේශසීමාවලින් ඔබ්බට විහිදේ. 2024 දෙසැම්බර් මාසයේදී, බ්‍රසීල බලධාරීන් බහියා හි කැමසාරි හි නව BYD කම්හලක් සඳහා ඉදිකිරීම් ස්ථානයක, අවම වශයෙන් චීන කම්කරුවන් 163 දෙනෙකු අභිචෝදකයන් විසින් "වහල්භාවයට සමාන කොන්දේසි" ලෙස විස්තර කළ තත්වයෙන් බේරා ගත්හ. පසුගිය වසරේ ආසියාවෙන් පිටත සමාගමේ පළමු මගී මෝටර් රථ කම්හල විවෘත කිරීම ප්‍රමාද කරමින් එම ස්ථානය වසා දමන ලදී.

HK කම්කරු අයිතිවාසිකම් නිරීක්ෂක වෙබ් අඩවියට (HK Labour Rights Monitor website) අනුව, "පරීක්ෂණයෙන් කම්පනය සහගත අපයෝජන අනාවරණය විය: සමහර සේවකයින් හිස් ඇඳන් මත නිදා ගත් අතර, පුද්ගලයෝ 31 දෙනෙකු එකම වැසිකිළියක් පාවිච්චි කළහ. ආහාර සහ පුද්ගලික අයිතම අපිරිසිදු තත්වයන් යටතේ ගබඩා කර තිබුණි. වාර්තා වන පරිදි, සේවකයින්ට අලුයම 4 ට පමණ වේලාසනින් අවදි වීමට බල කෙරුණි, විවේක දින නොමැතිව අධික වැඩ පැය ගණනක් විඳදරාගත් අතර සමහර අවස්ථාවල දින 25 ක් අඛණ්ඩව වැඩ කළහ."

කම්කරුවන්ගේ විදේශ ගමන් බලපත්‍ර රඳවා ගන්නා ලද අතර, වැටුප් වලින් සියයට 60 ක් දක්වා අත්හිටුවා, දිනකට පැය 12 ක් දක්වා, සතියේ දින හතේම, අඛණ්ඩව දින 25 ක් වැඩ කිරීමට බල කෙරුණි. පසුව ෆෙඩරල් නඩු පවරන්නන් රිඉස් මිලියන 257 ක (ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 45) වන්දි ඉල්ලා නඩුවක් ගොනු කළ අතර, පසුව රිඉස් මිලියන 40 ක් පමණක් ගෙවීමට එය සමථ වී ඇත.

2008 සිට 2025 දක්වා වසර 17ක් පුරා, BYD හි කම්කරු පිළිවෙතට ලොව ධනවත්ම පුද්ගලයින්ගෙන් කෙනෙකු වන බහු-ප්‍රකෝටිපති සමපේක්ෂක වොරන් බෆට් (Warren Buffett) වක්‍රව සහාය ලබා දී ඇත. බෆට්ගේ ආයෝජන උපකරණය වන බර්ක්ෂයර් හැතවේ (Berkshire Hathaway), BYD හි ප්‍රධාන කොටස් හිමිකරගෙන සිටි අතර, බෆට්ගේ මියගිය ව්‍යාපාර සහකරු චාලි මුන්ගර් (Charlie Munger) ගේ උනන්දු කිරීම පරිදි, මුලින් 2008 දී, ඩොලර් මිලියන 230 කට එය අත්පත් කර ගන්නා ලදී. මුන්ගර් වැන්ග් චුවාන්ෆු (Wang Chuanfu) "තෝමස් එඩිසන් සහ ජැක් වෙල්ච්ගේ (Jack Welch) සංයෝජනයක්" ලෙස විස්තර කළේය.

එහි උච්චතම අවස්ථාවේදී, බර්ක්ෂයර් හි BYD කොටස් වටිනාකම ඩොලර් බිලියන 9 ඉක්මවිය–එය දළ වශයෙන් 40 ගුණයක ලාභයකි. ආයෝජනයෙන් ඇස්තමේන්තුගත ඩොලර් බිලියන 7 ක ලාභයක් උපයා ගත ඇත. මෙම කාලය පුරාම, BYD සේවකයින් දරිද්‍රතා වැටුප්, වැඩ වර්ජන සඳහා පොලිස් මර්දනයන්, විදේශයන්හි විදේශ ගමන් බලපත්‍ර රඳවා ගැනීම් සහ ක්‍රමානුකූලව කඩ කරන ලද පොරොන්දු විඳදරා ගනිද්දී, බර්ක්ෂයර් හැතවේ ප්‍රමුඛ කොටස් හිමියෙකු ලෙස රැඳී සිටිමින්, එහි සහ පෞද්ගලිකව බෆට්ගේ කීර්තිය සමාගමට ලබා දුන්නේය.

බර්ක්ෂයර් 2022 අගෝස්තු මාසයේදී තම කොටස් විකිණීම ආරම්භ කළ අතර 2025 මුල් භාගය වන විට එහි පිටවීම සම්පූර්ණ කළේය. බෆට් BYD හි අධික ලෙස සූරාකෑමේ ශ්‍රම පිළිවෙත් පිළිබඳව කිසිදු විවේචනයක් ඉදිරිපත් කළේ නැත. ඔහුගේ එකම ප්‍රසිද්ධ ප්‍රකාශය වූයේ, 2023 දී, BYD යනු "අපූර්ව පුද්ගලයෙකු" විසින් පවත්වාගෙන යනු ලබන "අපූර්ව සමාගමක්" බවයි. එනමුත්, තමන් "මුදල් වලින්, වඩා හොඳ හැඟීමක් ඇති කරන දේ සොයා ගන්නා බව" ඔහු පැවසීය.

BYD හි පුණරාවර්තනය වන වැඩවර්ජන මගින් චීනයේ ධනවාදී සූරාකෑමේ ස්වභාවය සහ ලෝකයේ ප්‍රමුඛ විදුලි වාහන නිෂ්පාදකයා ලෙස BYD හි නැගීම හෙළි වේ. 2024 දී යුවාන් බිලියන 777.1 ක ආදායමක් සහ යුවාන් බිලියන 40 කට වඩා වැඩි ශුද්ධ ලාභයක් BYD වාර්තා කළේය. වැන්ග් චුවාන්ෆුගේ පෞද්ගලික ධනය ඔහුව පෘථිවියේ ධනවත්ම පුද්ගලයින් අතරට පත් කරයි–පසුගිය වසරේ Forbes සඟරාව විසින් චීනයේ බිලියනපතියන් අතරින් 9 වන ධනවත්ම පුද්ගලයා ලෙස ඔහුව ලැයිස්තු ගත කෙරුණි.

එහෙත් බොහෝ කර්මාන්තශාලා වල, මෙම ධනය නිෂ්පාදනය කරන–චීනයේ විශාලතම ප්‍රසිද්ධියේ වෙළඳාම් කරන (publicly traded company) සේවා යෝජකයා බවට BYD පත් කරන දැන් 900,000 කට වඩා වැඩි සංඛ්‍යාවක් වන–කම්කරුවන්ට ලැබෙන්නේ අධික වෙහෙසකින් අතිකාල කිරීමෙන් තොරව මූලික ජීවන වියදම් සපුරාලීමට නොහැකි වන වැටුපකි.

නීත්‍යානුකූලව අවසර ලත් එකම වෘත්තීය සමිති ආයතනය වන සමස්ත චීන වෘත්තීය සමිති සම්මේලනය (All-China Federation of Trade Unions), කම්කරුවන්ගේ ස්වාධීන සංවිධානය මර්දනය කරමින් සහ අනෘප්තිය හානිකර නොවන මාර්ග වෙත යොමු කරමින්, කම්කරුවන්ගේ

නියෝජිතයෙකු ලෙස නොව කළමනාකරණයේ සහ රාජ්‍යයේ හස්තයක් ලෙස ක්‍රියා කරයි. සංවිධානය වීමට හෝ විරෝධතා දැක්වීමට උත්සාහ කරන කම්කරුවන්, වේගයෙන් පොලිස් මර්දනය, සේවයෙන් පහ කිරීම සහ රඳවා තබා ගැනීමකට මුහුණ දෙති.

වුක්සි, චෙන්ග්ඩු සහ චැංෂා හි ඊට පෙර සිදු වූ දේ මෙන්, ෂියාන් වැඩ වර්ජනයෙන් පෙන්නුම් කරන්නේ චීන කම්කරු පන්තිය මෙම කොන්දේසි පිළිගැනීමට සූදානම් නැති බවයි. චීන රාජ්‍ය මාධ්‍ය සහ නිලධරය කාර්මික ක්‍රියාමාර්ග පිළිබඳ සංඛ්‍යාලේඛන ප්‍රසිද්ධ නොකලත්, චීනයෙන් පිටත සිට වැඩ වර්ජන ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමට උත්සාහ කරන සංවිධානවලට අනුව, විශේෂයෙන් නොගෙවූ වැටුප් සහ වැටුප් කප්පාදුවලට එරෙහිව 2023 සිට හදිසි වැඩ වර්ජන සහ විරෝධතා කැපී පෙනෙන ලෙස වැඩි වී තිබේ.






මෙම ලෝක සමාජවාදී වෙබ් අඩවි කර්තෘ මණ්ඩලයේ 2025 නව අවුරුදු ප්‍රකාශය Mehring Books වෙතින් ඇණවුම් කරන්න.


# එප්ස්ටයින් ලිපිගොනු ඇමරිකානු කතිපයාධිකාරයේ සාපරාධීත්වය හෙළි කරයි

**ජේකබ් ක්‍රොස්** විසිනි.

මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(ලෝසවෙඅ) 2026* පෙබරවාරි *02* දින ***'Epstein files reveal criminality of American oligarchy'*** යන හිසින් පලවූ ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

ලේඛනවල නම් කර ඇති අනෙක් අය අතර: එප්ස්ටයින් සමඟ ඡායාරූපවල දැක්වෙන සහ ඔවුන්ගේ සම්බන්ධතා පිළිබඳ නව ආලෝකයක් විහිදුවන විද්‍යුත් තැපැල් ලිපිවල පෙනී සිටින" හිටපු කුමරු ඇන්ඩෲ ("ආදිපාදවරයා-The Duke" ලෙස හඳුන්වනු ලැබේ); ඡායාරූප සහ සම්බන්ධතා ද්‍රව්‍යවල පෙනී සිටින බ්‍රිතාන්‍ය බිලියනපති රිචඩ්



1997 අප්‍රේල් මාසයේදී නිව් යෝර්ක් නගරයේ පැවති වික්ටෝරියාස් සීක්‍රට් "දේවදූතයන්" සාදයේදී ඩොනල්ඩ් ට්‍රම්ප් (වමේ) ජෙෆ්රි එප්ස්ටයින් සහ බෙල්ජියම් නිරූපිකාවක් වන ඉන්ග්‍රිඩ් සයින්හේව් සමඟ. [ඡායාරූපය: කොන්ග්‍රසයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩල අධීක්ෂණ කමිටුව]

සිකුරාදා, අධිකරණ දෙපාර්තමේන්තුව මූල්‍යකරු සහ ලිංගික ජාවාරම්කරු ජෙෆ්රි එප්ස්ටයින්ට අදාළ වීඩියෝ 2,000 කට වැඩි ප්‍රමාණයක් සහ පින්තූර 180,000 ක් ඇතුළුව ලේඛන මිලියන තුනකට වඩා නිකුත් කළේය.

මෙම ලේඛන, ලිංගික අපයෝජන සඳහා ළමයින් ජාවාරම් කරන ගණිකා සේවා ජාල පවත්වාගෙන ගිය එප්ස්ටයින්, ට්‍රම්ප්, වත්මන් ලෝකයේ ධනවත්ම මිනිසා (එලොන් මස්ක්) සහ ලෝකයේ හිටපු ධනවත්ම මිනිසා (බිල් ගේට්ස්) සමඟ සම්බන්ධ කරයි.

බ්‍රැන්සන්; රැස්වීම් සහ රාත්‍රී භෝජන සංග්‍රහ පිළිබඳ කාලසටහන් සහ ලිපි හුවමාරුවේ ලැයිස්තුගත කර ඇති හිටපු භාණ්ඩාගාර ලේකම් සහ හාවඩ් අධිපති ලෝරන්ස් සමර්ස්; 2008 දී වරදකරු වීමෙන් පසුව පවා එප්ස්ටයින්ගේ නිව්යෝර්ක් මන්දිරයේ රැඳී සිටි බව විස්තර කරන හිටපු ඊශ්‍රායල අගමැති එහුඩ් බරක් (Ehud Barak); සහ එප්ස්ටයින් විසින් ඔහුට කාන්තාවන් සැපයීමට කටයුතු කරන ආකාරය විස්තර කරන ඊමේල්වල ඇතුළත් "නිව්යෝර්ක් ජයන්ට්ස්" හි සම හිමිකරු වන බිලියනපති ස්ටීව් ටිෂ්.

අනෙක් අය අතර හිටපු ජනාධිපති බිල් ක්ලින්ටන්, ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ හිටපු උපදේශක ස්ටීව් බැනන් සහ එප්ස්ටයින්ගේ සම්බන්ධතා පොත්, ගුවන් ගමන් ලොග් සහ අභ්‍යන්තර සන්නිවේදනයන් හි නම් ඇතුළත් වන, පුළුල් පරාසයක බිලියනපතියන්, මූල්‍යකරුවන්, කීර්තිමත් පුද්ගලයින් සහ නිලධාරීන් ඇතුළත් වේ. නම් කර ඇති සමහර දෙනෙක් වරද ප්‍රතික්ෂේප කරන අතර අහඹු සම්බන්ධතා පමණක් පිළිගනිති. නමුත්, ලිපිගොනු එප්ස්ටයින්ගේ අපරාධ ව්‍යාපාරය වටා කක්ෂගතව සිටි තදින් අන්තර් සම්බන්ධිත ගෝලීය ප්‍රභූ පැලැන්තියක බියකරු චිත්‍රයක් සපයයි.

එප්ස්ටයින් දශක ගණනාවක් තිස්සේ ජාත්‍යන්තර ලිංගික ජාවාරම් මෙහෙයුමක් පවත්වාගෙන ගිය මූල්‍යකරුවෙකු වූ අතර, ඔහු සහ ඔහුගේ ධනවත් සහ බලවත් සහචරයින් සඳහා බාලවයස්කාර ගැහැණු ළමයින් සැපයුවේය. 2008 දී ෆ්ලොරිඩාවේ ගණිකා සේවාව සඳහා බාලවයස්කරුවන් ලබා ගැනීම සම්බන්ධයෙන් වරදකරු වීමෙන් පසු, එප්ස්ටයින්ට, පසුව ට්‍රම්ප්ගේ කම්කරු ලේකම් (ඇමති) ලෙස සේවය කළ ඇලෙක්ස් ඇකෝස්ටා විසින් පිළියෙළ කරන ලද වාසි සහගත ගනුදෙනුවක් පිරිනැමිණි.

නඩු පවරන්නන්, වින්දිතයින් 30 දෙනෙකු හඳුනාගෙන තිබියදීත්, මෙම ගනුදෙනුව මගින් එප්ස්ටයින්ට වැඩ සඳහා නිදහස් කිරීමක් සහිතව ප්‍රාන්ත බන්ධනාගාරයක මාස 15 ක් රැඳවුමක් පමණක් ලැබුණි. ඩේලි බීස්ට් හි 2019 වාර්තාවකට අනුව, ඇකෝස්ටා ට්‍රම්ප්ගේ සංක්‍රාන්ති නිලධාරීන්ට පැවසුවේ තමන් එම ගනුදෙනුව සකස් කළේ "එප්ස්ටයින් 'ඔහුගේ වැටුප් ශ්‍රේණියට වඩා ඉහළින්' ('අත ගැසීමට සුදුසු නොවන තරම් ඉහලින්) සිටින බැවින් ඔහුට පසුබහින ලෙස ඔහුට කියා තුබූ" නිසා බවයි." ඇකෝස්ටා මෙසේ පැවසූ බව වාර්තා වේ: "එප්ස්ටයින් 'බුද්ධි අංශයට අයත්' බවත් එය අත් හැර දමන ලෙසත් මට පැවසුවා."

2019 ජූලි මාසයේදී ෆෙඩරල් ලිංගික ජාවාරම් චෝදනා මත එප්ස්ටයින් නැවතත් අත්අඩංගුවට ගන්නා ලදී. 2019 අගෝස්තු 10 වන දින මැන්හැටන්හි මෙට්‍රොපොලිටන් නිවැරදි කිරීමේ මධ්‍යස්ථානයේ ඔහුගේ සිර මැදිරිය තුළ ඔහු මියගොස් සිටියදී සොයා ගන්නා ලදී. රජය සහ මාධ්‍ය කිසිදු බැරෑරුම් පරීක්ෂණයකින් තොරව වහාම එය සියදිවි නසාගැනීමක් ලෙස තීන්දු කළේය.

ප්‍රමාණවත් සාක්ෂි තිබියදීත්, ප්‍රමුඛ දේශපාලනඥයින් සහ ව්‍යාපාරික නායකයින් අතර එප්ස්ටයින්ගේ සේවාදායකයින් කිසිවෙකු වරදකරුවන් කිරීම කෙසේ වෙතත්, ඔවුන් එක් අයෙකුටවත් එරෙහිව චෝදනාවක් වත් එල්ල වී නැත.

ට්‍රම්ප්ගේ 2024 මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයට විශාලතම තනි පරිත්‍යාගශීලියා වන මස්ක් ගේ නම නිකුතුව පුරාම දැකිය හැකි අතර, ඔහුගේ නම 1,000 වතාවකට වඩා සඳහන් වී ඇත. බාලවයස්කරුවන් ජාවාරම් කිරීම සම්බන්ධයෙන් එප්ස්ටයින් වරද පිළිගෙන තිබියදීත්, ඉන් වසර හතරකට පසු 2012 නොවැම්බර් මාසයේදී, මස්ක් ඔහුට විද්‍යුත් තැපෑලක් යවමින්, "ඔබේ දිවයිනේ පවත්වන පිස්සුම දිවා/රාත්‍රී සාදය කවදා වේවිද?" යනුවෙන් විමසීය.

2013 දෙසැම්බර් මාසයේදී, මස්ක් නැවතත් එප්ස්ටයින් හමුවීමට උත්සාහ කරමින්, "නිවාඩු සමය තුළ (මම) BVI/ St. Bart's ප්‍රදේශයේ සිටිනු ඇත. මුණගැසීමට හොඳ අවස්ථාවක් තිබේද?" යනුවෙන් ලිවීය. එප්ස්ටයින් ප්‍රතිචාර දැක්වූයේ, "මම ඔබ වෙනුවෙන් හෙලිකොප්ටරයක් එවන්නම්." එප්ස්ටයින්, මස්ක් සහ එප්ස්ටයින්ගේ සහායක ලෙස්ලි ග්‍රොෆ් අතර පසුකාලීන ඊමේල් මගින් 2014 ජනවාරි මස මුලදී දිවයිනට යන ගමන් සම්බන්ධයෙන් අඛණ්ඩ සම්බන්ධීකරණයක් පෙන්නුම් කෙරේ.

මෙම ඊමේල්, 2019 දී *Vanity Fair* වෙත මස්ක් කළ ප්‍රකාශයට පටහැනි වන අතර, එහිදී ඔහු එප්ස්ටයින්ගේ දූපතට එන ලෙස වූ නැවත නැවත ආරාධනා ඔහු "ප්‍රතික්ෂේප කළ" බවත් කිසි විටෙකත් සංචාරය නොකළ බවත් සඳහන් කරයි. ගිය සති අන්තයේ දී, මස්ක් ඊමේල් වාර්තා "ව්‍යාජ" ලෙසත්, ලිපිගොනු "අවධානය වෙනතකට යොමු කිරීමක්" ලෙසත් හෙළා දුටුවේය.

ගේට්ස් ද කැපී පෙනෙන ලෙස පෙනී සිටියි. 2013 දී ඇති එක් විද්‍යුත් මේල් පණිවිඩයක, එප්ස්ටීන් ගේට්ස්ව බ්ලැක්මේල් කිරීමට උත්සාහ කළ බව පෙනෙයි.

එහිදී ගේට්ස්ගේ ලිංගාශ්‍රිත රෝගය පිළිබඳ විද්‍යුත් තැපැල් මකා දැමීමට කිරීමේ ඉල්ලීම්, මෙලින්ඩා ගේට්ස්ට රහසිගතව ලබා දීමට එප්ස්ටීන්ගෙන් ප්‍රතිජීවක ඖෂධ සඳහා ඉල්ලීම් සහ පැහැදිලි ලිංගික විස්තර සඳහන් කර ඇත. ඩොලර් මිලියන ගණනක් දෙන ලෙසත් ඔහු වෙනුවෙන් නිවසක් මිලදී ගැනීමටත් එප්ස්ටයින් ගේට්ස්ට යෝජනා කළේය. මෙලින්ඩා ගේට්ස් පසුව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ ඇගේ දික්කසාදය සිදු වූයේ ඇගේ සැමියා එප්ස්ටයින් සමඟ පැවැත්වූ සම්බන්ධය නිසා බවයි. එහිදී ඇය එප්ස්ටයින් "දුෂ්ට" ලෙස විස්තර කළාය.

2008 දී එප්ස්ටයින් වරදකරු වී වසර ගණනාවකට පසුවත්, ලිංගික සබඳතා සඳහා කාන්තාවන් ලබා ගැනීම සඳහා එප්ස්ටයින්ගේ උදව් ඉල්ලා සිටින New York Giants හි සම හිමිකරු වන බිලියනපති ස්ටීව් ටිෂ්ගේ ඊමේල්ද ලිපිගොනු අතර වේ. ලිපි හුවමාරුවලින් හෙළි වන්නේ එප්ස්ටයින් ප්‍රභූ සේවාදායකයින්ගේ දැනුම ඇතිව ජාවාරමේ ක්‍රියාකාරීව නිරත වූ බවයි. ටිෂ් යනු නිව් යෝර්ක් නගරාධිපති සොහ්රාන් මම්දානි විසින් නැවත පත් කරන ලද NYPD (නිව්යෝක් පොලිස් දෙපාර්තමේන්තු) කොමසාරිස් ජෙසිකා ටිෂ්ගේ ඥාති සහෝදරයෙකි.

ලිපිගොනු එප්ස්ටයින්ගේ ජාලයේ ජාත්‍යන්තර විෂය පථය අවධාරණය කරයි. අලුතින් නිකුත් කරන ලද ඡායාරූපවලින් පෙනී යන්නේ කලින් ඇන්ඩෲ කුමරු වූ ඇන්ඩෲ

මවුන්ට්බැටන්-වින්ඩ්සර්, මුහුණ වසන ලද තරුණ කාන්තාවකගේ සිරුරට ඉහලින් බරවී සිටින ආකාරයයි. බ්‍රිතාන්‍යයේ, New Labour හි ප්‍රධාන නිර්මාතෘ වරයෙක් වන පීටර් මැන්ඩෙල්සන්ට, එප්ස්ටයින්ගෙන් ඩොලර් 25,000 ගෙවීම් තුනක් ලැබුණු බව හෙළි වීමෙන් පසු පක්ෂ භූමිකාවකින් ඉල්ලා අස්විය.

වාණිජ ලේකම් (ඇමති) හොවාර්ඩ් ලුට්නික් ද එප්ස්ටයින් ගෙන් දුරස්ථ වීමට උත්සාහ කළ අතර, එප්ස්ටයින්ගේ මහල් නිවාසයේ "සම්බාහන මේසයක්" දැකීමෙන් පසු 2005 දී ඔහු සබඳතා කපා දැමූ බව ඔහු කියා සිටියේය. කෙසේ වෙතත්, ඊමේල් මගින් පෙන්නුම් කරන්නේ ලුට්නික් 2012 අගභාගයේදී තරම් , එනම් (එප්ස්ටයින්) වරදකරු වීමෙන් පසුව ද, එප්ස්ටයින් සමඟ ලිපි හුවමාරු කර ගත් බවයි. 2012 දෙසැම්බර් මාසයේ එක් විද්‍යුත් තැපෑලකට අනුව, ලුට්නික් තම පවුලේ අය සහ වයස අවුරුදු හතේ සිට 16 දක්වා දරුවන් සමඟ සංචාරය කරමින් සිටියදී කැරිබියන් වල රාත්‍රී භෝජන සැලසුම් සම්බන්ධීකරණය කළේය.

සමස්ත ආන්ඩු, බැංකු සහ සමාගම් පවත්වාගෙන යන මෙම බලගතු පුද්ගලයින් කියා සිටින්නේ එප්ස්ටයින් යනු කවුරුන්දැයි (සැබෑ ස්වභාවය) තමන් දැන නොසිටි බවයි. මොන මනස්ගාතයක් ද, හැමෝම දැන සිටියා! ඔහුගේ සම්බන්ධතාවල දැවැන්ත පරිමාණය, ඔහුගේ ජාලයේ අසාමාන්‍ය ප්‍රවේශය/පැතිරි දුර, පාලක පන්තියේම ස්වභාවය ගැන හෙළිදරව් කරයි.

ලේඛන නිකුත් කෙරුනද, නිකුත් කරන ලද දේ සහ කුමන තොරතුරු ඉවත්කර (redact) ඇත්ද යන්න ඇතුළුව, සෑම අංගයක්ම වංචාවෙන් ආවරණය වී ඇත. සිකුරාදා සවස එප්ස්ටයින්ගේ වින්දිතයින් 20 දෙනෙකු විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක, අත්සන් කරන්නන් මෙසේ ලිවීය: "ජෙෆ්රි එප්ස්ටයින් ලිපිගොනු වල මෙම නවතම නිකුතුව විනිවිදභාවයක් ලෙස අලෙවි කරනු ලැබේ, නමුත් එය ඇත්ත වශයෙන්ම කරන්නේ වින්දිතයන් හෙළිදරව් කිරීමයි. නැවත වරක්, වින්දිතයන් ගේ නම් සහ හඳුනාගැනීමේ තොරතුරු හෙළිදරව් කරමින් පවතින අතර, අපව අපයෝජනය කළ පිරිමින් සඟවා ආරක්ෂා කර ඇත."

වඩාත් මූලික දේශපාලන ප්‍රශ්නවලට පිළිතුරු නොලැබෙන අතර, එය පාලක පන්තිය අතේ පැවතුනහොත්, දිගටම පිළිතුරු නොලැබෙනු ඇත. එප්ස්ටයින් ස්වාධීන ක්‍රියාකරුවෙකු නොවීය. ඔහු සේවය කළේ කාගේ අවශ්‍යතා සඳහාද? ඔහු සීඅයිඒ, මොසාඩ් හෝ වෙනත් බුද්ධි ආයතනයක් සඳහා සේවය කළේද? එප්ස්ටයින් "බුද්ධි අංශයට අයත්" බවට ඇකෝස්ටා කළ ප්‍රකාශය කිසි විටෙකත් විමර්ශනය කර නොමැත.

සම්බන්ධ වූ නිශ්චිත පුද්ගලයින්ට අමතරව, එප්ස්ටයින් අපචාරය සමාජ පන්තියක ස්වභාවය හෙළි කරයි. ඇමරිකානු කතිපයාධිකාරය පරපෝෂිතභාවය, සමපේක්ෂණය සහ වංචාව හරහා තම ධනය රැස් කරගෙන ඇත. එය, එහි සමාජ පැවැත්ම තුළ, අත්පත් කර ගැනීමේ ආකාරය තුල, ඇමරිකානු දේශපාලනයේ මුදුනේ ලැග සිටින අපරාධකාරී පන්තියකි. එහි ධනය, මූල්‍ය උපාමාරු, සංගතවල වංචා, යුද ලාභ ලැබීම සහ බිලියන සංඛ්‍යාත ජනතාව සූරාකෑමේ ප්‍රතිඵලයකි.


කතිපයාධිකාරය තමන් නීතියට ඉහළින් සිටින බවට වන හැඟීමක් දරා සිටී. ට්‍රම්ප් යනු මෙම පන්තියේ පුද්ගලාරෝපණයයි—ඔහු නිර්ලජ්ජිත ලෙස අපරාධකාරී, ප්‍රජාතන්ත්‍රවාදී සම්මතයන්ට අපහාස කරන, විවෘතව ෆැසිස්ට් ප්‍රචණ්ඩත්වය උසිගන්වන සහ යුද්ධයට කුමන්ත්‍රණය කරන අයෙකි. ඔහුගේ පරිපාලනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වැදගැම්මකට නැති කඩදාසි කැබැල්ලක් ලෙස සලකන අතර ජාත්‍යන්තර නීතිය අදාළ නොවේ යයි සලකයි. උප ජනාධිපති ජේ.ඩී. වැන්ස්ගේ වචන වලින් කිවහොත්, "නිරපේක්ෂ දණ්ඩමුක්තිය" සහිතව, පුරවැසියන් හෝ පුරවැසියන් නොවන පුද්ගලයින් ඝාතනය කිරීමේ අයිතිය එය ප්‍රකාශ කරයි.

ඇමරිකානු පාලක පන්තිය දේශපාලනික, සමාජීය, නීතිමය සහ සදාචාරාත්මක පරිහානියක ගිලී සිටී. එප්ස්ටයින් අපචාරය එයට කැඩපතක් ඔසවා තබයි.

**මෙම පොත් Mehring Books වෙතින් ඇනවුම් කරන්න.**

Mehring Books



Socialism AI
by the WSWS
Ask a question
SocialismAI.com

මාක්ස්වාදය හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්න ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් නිර්මිත ආවර්ධිත බුද්ධියේ නව යෙදුම

Socialism AI වෙතින් අසන්න. SocialismAI.com වෙත පිවිසෙන්න.

**අපගේ සියලුම පාඨකයින්ට Socialism AI හි සාමාජික වී එය ඔබගේ දෛනික දේශපාලන අධ්‍යාපනයේ හා ක්‍රියාකාරකම්වල කොටසක් කර ගැනීමට අපි ආරාධනා කරමු.**

**2026 දී සියල්ල රඳා පවතින්නේ අප කරන දේ මත ය. සමාජවාදය සඳහා සටනට සංවිධානය සහ දේශපාලන ඉදිරිදර්ශනය අවශ්‍ය වේ. කිසිවක් ස්වයංක්‍රීයව සිදු නොවේ. ධනවාදය නැවත වරක් මානව වර්ගයා ප්‍රශ්න පිළිබඳ ප්‍රශ්නයට යොමු කරයි: එනම් සමාජවාදය ද ම්ලේච්ඡත්වය ද යන ප්‍රශ්නයයි.**

**අප ජීවත් වන්නේ පන්ති සමාජයක ය.  එහි කම්කරු පන්තියේ පැත්ත ගන්න. ලෝකය යහපත් ලොවක් බවට පරිවර්ථනය කළ හැක්කේ කම්කරු පන්තියේ නායකත්වය යටතේ එම පන්තිය ද සෙසු පීඩිත ජනතාව ද එක්සත් කිරීමෙන් පමණි. ඒ සඳහා එහි ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා එහි ශාඛා ගොඩනගන්න. ලෝක සමාජවාදී වෙබ් අඩවියේ අලුත් අවුරුදු අරමුදලට සහාය දෙන්න. ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය සහ වැඩසටහනෙන් කම්කරු පන්තිය සන්නද්ධ කිරීමේ සටනට සහාය දෙන්න, එක් වන්න.**

**The Socialist** සඟරාව ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) විප්ලවවාදී වාම කන්ඩායම වන ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) හි ඩිජිටල් මාසික ප්‍රකාශනයයි. එහි සියලු කලාප download කර ගැනීමට මෙහි පිවිසෙන්න: https://www.thesocialist.lk/monthly-magazine/  මෙහි පළකරනු ලබන සියලු ලිපි පිළිබඳ ඔබගේ අදහස් හා අපව සම්බන්ධ කර ගැනීම සඳහා අපට ලියන්න: socialistlead@gmail.com. අපගේ වෙබ් අඩවිය theSocialist.lk නිති පතා කියවන්න. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (හජජාක) ලෝක ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය දිනපතා කියවන්න: wsws.org. සසප යනු හජජාක ලංකා ශාඛාවයි

**ලංකාවේ සමාජවාදී සඟරාව, The Socialist ඩිජිටල් කලාප ඔබගේ හිතවතුන් අතර බෙදා හරින්න.** සඟරාව WhatsApp හරහා ලබා ගැනීමට 0777497101 වෙතින් ඉල්ලුම් කරන්න.

විප්ලවවාදී නායකත්වය ලෙස සසප ගොඩ නගන්න! අප හා එක්වන්න!

World Socialist Web Site WSWS.ORG

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලිපි දිනපතා කියවන්න